වාර්ෂික වාර්තාව - 2023

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කර ගත් පුරෝගාමී ආයතනයක් වීම.

මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

සභාපතිතුමාගේ පණිවිඩය



1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ 1969 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වසර 54කට අධික ආයුර්වේද සුවසේවාවක නිරත එකම රාජ්‍ය සංස්ථාවයි.

2023 වර්ෂයේ ආරම්භය වනවිට පරිපාලනමය හා මූල්‍ය ගැටලු රාශියක් පැවති මෙම සංස්ථාව අර්බුදකාරී තත්ත්වයකට පත්ව තිබුණි. එම අර්බුදකාරී තත්ත්වයන් හා පොදුවේ රටතුළ පැවති ආර්ථික අර්බුදකාරී වාතාවරණය තුළ 2023 ජනවාරි මාසයේදී නව කළමනාකාර අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම, මැයි මාසයේදී නව සභාපතිවරයකු හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම සිදුවිය.

මෙම සංස්ථාව වෙත පැවරී ඇති ජාතික මෙහෙවර ඉටුකිරීම සඳහා දිගුකාලීන සැලසුම් සකස් කරන ලද අතර පැවති අර්බුදකාරී තත්ත්වයට කඩිනම් විසඳුම් සෙවීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව වසර මුල පැවති රුපියල් මිලියන 300කට අධික හිඟ ණයහිමි ගෙවීම්ද පියවමින් 2023 වර්ෂයේ ලාභය රුපියල් මිලියන 195ක වාර්තාගත තත්ත්වයකට පත් කිරීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයකි.

ගෙවීගිය වසර තුළ ඉටුකළ කාර්යයන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී,

- සංස්ථා ඉතිහාසයේ වැඩි නිෂ්පාදන වටිනාකම සහ වැඩිම අලෙවි වටිනාකම වාර්තා කරමින් ඉලක්ක ළඟා කර ගැනීමට 2023 වර්ෂයේදී හැකියාව ලැබුණි. ඒ අනුව 2022 වර්ෂයට සාපේක්ෂව නිෂ්පාදනය 30 % සහ අලෙවිය 28% වර්ධනය කර ගැනීමට හැකිවිය.
- 1969 මැයි මස 11 දිනැති අංක 14853/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත මෙම සංස්ථාවේ අරමුණු 07 අරමුණු 10 දක්වා පුළුල් කර ගනිමින් 2023 නොවැම්බර් 01 දිනැති අංක 2356/21 අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කිරීම තුළින් සමස්ථ ආයුර්වේද සුවසේවාවම ආවරණය කිරීමට අවශ්‍ය නෛතික පසුබිම සකස් කිරීම.
- මෙම සංස්ථාව මඟින් ආයුර්වේද රෝහල්, බෙහෙත්ශාලා, වෛද්‍යවරුන් හා මහජනතාව වෙත බෙදාහැරීමට ඖෂධ වර්ග හිඟයක් පැවතිනි. ඒවා මහහරවමින් සියලු ඖෂධ නිෂ්පාදනය කිරීමට හා ප්‍රමාණවත් ඖෂධ ගබඩා පවත්වාගෙන යාම.
- නව නිෂ්පාදන හඳුන්වා දීම, නිෂ්පාදන නව්‍යකරණය නව ඇසුරුම් හා ඇසුරුම් ක්‍රම හඳුන්වා දීම මෙන්ම නිෂ්පාදන තත්ත්වය සහතික කිරීම සඳහා තත්ත්ව පාලන ක්‍රියාවලිය පවත්වාගෙන යාම හා ජාතික හා ජාත්‍යන්තර තත්ව සහතික ලබා ගැනීම.
- නිෂ්පාදනාගාරයන්හි භාවිතයට නොගත් යන්ත්‍ර භාවිතයට ගැනීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීම, නව ඇඹරුම් හා ඇසුරුම් යන්ත්‍ර ස්ථාපිත කිරීම සිදුකරන ලද අතර නිෂ්පාදනයන්ට බහුලව භාවිතා කරන තලතෙල් හා පොල්තෙල් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.

- නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සංස්ථාවට අයත් අලෙවි මධ්‍යස්ථාන, දිස්ත්‍රික් අලෙවි නියෝජිත ජාලයට අමතරව ජාත්‍යන්තර ස්ථානීය හා මාර්ගගත අලෙවි නියෝජිත ජාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.
- සංස්ථාවේ සියලුම සේවා අංශ ඒකාබද්ධ වන පරිදි ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක නොවීම නිසා තොරතුරු හා වාර්තාකරණ ගැටලු බහුලව හඳුනාගත්නා ලදී. මෙම තත්ත්වය ජාතික විගණන කාර්යාලය මහින්ද වාර්ෂික වාර්තාවෙදී දැඩි අවධානයට ලක්කර තිබුනි. මේ පිළිබඳව අවධානය යොමු කරමින් Enterprise Resource Planning (ERP) පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලද අතර 2024 වර්ෂයේදී මෙම කාර්ය සම්පූර්ණ කිරීමට නියමිතව ඇත.
- 2023 වර්ෂය තුල සාර්ථක ව්‍යාපාරික හා සාමාජීය මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමට ගරු දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය නීතීඥ සිසිර ජයකොඩි මැතිතුමා ලබාදුන් මහපෙන්වීම, අමාත්‍යාංශ නිළධාරීන් ලබාදුන් සහය, ආයුර්වේද කොමසාරිස් ජනරාල්තුමා හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් හා නිළධාරීන් ලබාදුන් සේවය අතිශයින් අගය කරමි.
- 2023 වර්ෂයේ මෙම සාර්ථකත්වය ළඟා කරගැනීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂ නීතීඥ ගයා කාංචන මහතා සෘජුවම මැදිහත් වෙමින් ඉටුකරන ලද සුවිශේෂී කාර්යභාරය විශේෂයෙන් සිහිපත් කරමි. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය හා සියලුම කාර්ය මණ්ඩලය ඉටුකරන ලද කාර්යභාරය ද අගය කරමි.
- 2023 වර්ෂයේදී ඇතිකරගත් අඩිතාලම මත 2024 වර්ෂය තුළ ඉලක්ක ළඟා කරගනිමින් සාර්ථකත්වය ලඟා කරගැනීමට සැමගේ සහය, කැපවීම හා ආශිර්වාදය අපේක්ෂා කරමි.



ආචාර්ය අනුර ඇතුලත්මුදලි
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

අධ්‍යක්ෂවරු

ආචාර්ය අනුර ඇතුලත්මුදලි මහතා

2023.01.15 දින ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්වූ මෙතුමා 2023.05.02 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස කටයුතු කරමින් සිටී.

මෙතුමා 1992 වර්ෂයේදී රුසියානු ලුලුම්බා මිත්‍රත්ව සරසවියෙන් ජාතික ආර්ථික සැළසුම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද, 2000 වර්ෂයේදී එම සරසවියෙන්ම පශ්චාත් උපාධියද ලබාගෙන ඇත. ඒ අතරතුර කාලය තුල ලංකා තේ නාමය රුසියානු ජනරජයේ ප්‍රවර්ධනය කිරීමේ නියමුවකු ලෙස කටුයතු කර ඇත. ඉන්පසු H.V.A Foods Plc සමාගමේ උපදේශකවරයෙකු මෙන්ම කළමණාකරුවෙකු වශයෙන් ද කටයුතු කර ඇති අතර අනතුරුව ලංකාවේ ප්‍රධාන තේ අපනයන සමාගමක ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටුයුතු කර ඇත.

රුසියානු භාෂාව පිළිබඳ ප්‍රවීනයකු මෙතුමා, 2015 වසරේ සිට මේ දක්වා කොළඹ 07 ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ උප සභාපති ධුරයේ කටයුතු කරනු ලබයි.

නීතීඥ ගයා කාංචන මහතා

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂ වශයෙන් නීතීඥ ගයා කාංචන මහතා 2023.01.17 දින සිට කටයුතු කරනු ලබයි. වසර 25කට අධික කාලයක් වෘත්තීය නීතීඥවරයෙකු ලෙස කටයුතු කරන එතුමා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික මට්ටමේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරන අතර පෞද්ගලික ආයතනයක සභාපතිත්වය දරමින් වසර 25කට අධික කාලයක් ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ කටයුතු කරනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකාව නියොජනය කරමින් ජාතික සහ ජාත්‍යාන්තර මට්ටමේ රාජ්‍යතාන්ත්‍රික ව්‍යාපෘති කිහිපයකම කමිටු සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි.

ගීතාමනි සී කරුණාරත්න මහත්මිය

සහකාර ප්‍රාදේශිය ලේකම්වරියක වශයෙන් 1992 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයට සම්බන්ධවී ඇති විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියකි. ප්‍රථම උපාධිය රුහුණු විශ්වවිද්‍යාලයේ වාණිජ පීඨය මඟින්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන්ද ලබාගෙන ඇත. වසර 30ක සේවා කාලය තුළදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අමාත්‍යාංශ ඇතුළු රාජ්‍ය ආයතන රැසක සේවය කර ඇත. දැනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක වශයෙන් සේවය කරනු ලබයි.

චන්ද්‍රිකා සේනානායක මහත්මිය

2002 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සේවය ආරම්භ කර ඇත. එහි වසර 7කට ආසන්න කාලයක් සේවය කර 2008-2010 කාලය තුළ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සිය රාජකාරී කටයුතු සිදු කර ඇත. පසු කාලීනව 2010-2012 වර්ෂයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියක් ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේද, එම දෙපාර්තමේන්තුවේම 2012-2021 කාලය තුළ අධ්‍යක්ෂකවරියක් වශයෙන්ද සේවය කර ඇති චන්ද්‍රිකා සේනානායක මහත්මිය 2021 වර්ෂයේ සිට මේ දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරියක් වශයෙන් කටයුතු කරනු ලබයි.

ප්‍රථම උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය මඟින් ද, සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කොළඹ විශ්ව විද්‍යාලය මඟින් ද, මූල්‍ය ආර්ථික විද්‍යාව පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය මඟින්ද ලබා ඇත.

එම්. ඩී.ජේ. අබේගුණවර්ධන මහතා

1996 වර්ෂයේදී වෛද්‍ය නිලධාරියෙකු ලෙස රාජ්‍ය සේවයට පත්ව වර්ෂ 2008 දී මධ්‍යම පළාත් අයුර්වේද කොමසාරිස් තනතුරට පත්ව ඇත. වර්ෂ 2021 ජුනි මාසයේදී ආයුර්වේද කොමසාරිස් ලෙස පත්ව ඇති අබේගුණවර්ධන මහතා 2023 නොවැම්බර් මාසයේදී ආයුර්වේද කොමසාරිස් ජනරාල් තනතුරට පත්ව ඇත.

වර්ෂ 1996 දී කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනය වෙතින් BAMS උපාධියද, සබරගමුව විශ්වවිද්‍යාලය වෙතින් ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා එම විශ්ව විද්‍යාලය වෙතින් ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියද ලබා University of Asia වෙතින් DLitt පශ්චාත් උපාධියද ලබා ඇති අතර රාජ්‍ය සේවයේ වසර 27ක පරිපාලන හා කළමනාකරණ පරිචයන් සපුරා ඇත.

යූ.ජී. ඉන්දික පුෂ්පකුමාර මහතා

2023.01.27 දින සිට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් කටයුතු කරනු ලබන මෙතුමා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ගෞරව උපාධිය ලබාගෙන ඇත. ලලිත් ඇතුලත්මුදලි වෘත්තිය පුහුණු ආයතනය මඟින් මෙහෙයවනු ලබන පරිගණක ගිණුම්කරණය සම්බන්ධ ඩිප්ලෝමාව ලබාගෙන ඇත. වරලත් ගණකාධිකරණ ආයතනයේ ගණකාධිකරණය සම්බන්ධ පාඨමාලාව කරනු ලබන අතර, ආණ්ඩුකරණය හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ඩිප්ලෝමාව, ජාත්‍යන්තර නීතිය හා ජාත්‍යන්තර සාමය පිළිබඳ ඩිප්ලෝමාව, නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ඩිප්ලෝමාව යන ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් හදාරමින් සිටී. වර්තමානයේ මියන්මාරයේ හැපෑන් විශ්ව විද්‍යාලයෙන් (Hpa – An University Myanmar) ආචාර්ය උපාධිය හදාරමින් සිටී.

2010 වසරේ සිට 2017 වසර දක්වා සහකාර කර්මාන්තශාලා කළමණාකරු, කර්මාන්තශාලා කළමණාකරු, ගණකාධිකාරි සහ මුදල් කළමණාකරු යන තනතුරු වල විවිධ ආයතන වල සේවය කර ඇති අතර 2017 වසරේ සිට 2022 වසර දක්වා සී/ස එක්ස්පර්ට් කාර්ගෝ සර්විස් පුද්ගලික ආයතනයේ සාමාන්‍යාධිකාරි ලෙස සේවය කර ඇත.

එම්.එම්.එස්. පුංචිබණ්ඩාර මහතා

2023.06.02 වන දින සිට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන මෙතුමා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ සංවර්ධන උපාධිය ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා මොරටුව විශ්ව විද්‍යාලයෙන් මැණික් විද්‍යාව පිළිබඳ උපාධියත්, එක්සත් රාජධානියේ, මැණික් විද්‍යාව පිළිබඳව මැණික් විද්‍යා ආයතනයෙන් සාමාජිකත්වය ලබාගෙන ඇත. නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාලාභියෙකු වන අතර, මානව සම්පත් කළමනාකරණ ආයතනයෙන්ද, ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇත. තවද ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා ඇති අයෙකු වන අතර, පුහුණු කිරීම් කටයුතු සම්බන්ධව විවිධ ආයතන වල එනම්, පොදු රාජ්‍ය මණ්ඩලයේ සුළු හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසායකයින් පුහුණු කිරීමේ උපදේශයෙක් වශයෙන්ද කටයුතු කර ඇත.

තවද මොරටුව විශ්ව විද්‍යාලයේ බාහිර උපදේශකයෙකු වශයෙන්ද සේවය කර ඇති මොහු මැණික් සංස්ථාවේත්, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙත්, උසස් නිලතල දරා ඇති අතර, අවසාන වරට නැගෙනහිර පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ සභාපති වශයෙන් සේවය කර ඇත.

පටුන

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	-	01 - 19
ආයතනික පාලන වාර්තාව	-	20 - 21
විගණකාධිපති වාර්තාව	-	22 - 32
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	-	33
ආදායම් ප්‍රකාශය	-	34 - 35
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	-	36
ස්කන්ධ ප්‍රග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය	-	37
ගිණුම්කරණ ප්‍රතිපත්ති	-	38 - 51
ගිණුම් පිළිබඳ සටහන්	-	52 - 70
පසුගිය වසර 10ක වැදගත් මූල්‍ය විස්තර	-	71

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2023 වර්ෂය

01. හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංස්ථාව පිහිටුවා ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2023.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

02. ප්‍රධාන අරමුණු

1. ආයුර්වේද ඖෂධ වර්ග භෛසජ්‍ය ද්‍රව්‍ය සහ සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.
2. අත්‍යවශ්‍ය ආයුර්වේද, සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ යන දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.
3. දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.
4. ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.
5. ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.
6. ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළහිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වා ගෙන යාම.
7. ඖෂධ වර්ග පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.
8. ආයුර්වේදය ප්‍රකාරව ප්‍රතිකාර සහ සහන සපයනු ලබන වෛද්‍ය මධ්‍යස්ථාන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා මෙන්ම එවැනි මධ්‍යස්ථාන නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා උචිත තැනැත්තන් සහ ආනයන සමඟ ගිවිසුම් වලට ඇතුළත් වීම.
9. ආයුර්වේදය පිළිබඳ අධ්‍යයන පාඨමාලා සහ ආයුර්වේද වෘත්තියට අදාළ පුහුණු වැඩසටහන් සපයනු ලබන අධ්‍යයන නිසි ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමෙන් පසුව පිහිටුවීම, එවැනි පාඨමාලා සහ වැඩසටහන් තේරීම සහ සකස් කිරීම සම්බන්ධ තැනැත්තන් හෝ ආයතන සමඟ ගිවිසුම වලට ඇතුළත්වීම සහ ඒ හා සම්බන්ධ දේශන පැවැත්වීම. එවැනි පාඨමාලා සහ වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් සඳහා ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානය කිරීම.
10. වාණිජ කාර්ය සඳහා භාවිත කරනු ලැබිය හැකි වගාවේ ඵලදාව, අස්වැන්න හෝ අවශේෂ කොටස් ඇතුළත් වන්නා වූ ද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආයුර්වේද සංග්‍රහයේ නියම කරනු ලැබ ඇති පරිදි ආයුර්වේදයෙහි නියැලීමේ දී භාවිතා කිරීම සඳහා වූ ද ඖෂධීය ශාක වගා කිරීම සහ එම කටයුතු නහා සිටුවීමෙහිලා උචිත තැනැත්තන් සහ ආයතන සමඟ ගිවිසුම් වලට ඇතුළත් වීම.

03. ආයතනික තොරතුරු

3.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න දරණ ස්ථානයේ පිහිටා ඇත.

3.2 අලෙවි මධ්‍යස්ථාන

නාවින්න	: අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම.
විජේරාම (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ.
මහනුවර (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 70, යටිනුවර වීදිය, මහනුවර.
දියතලාව	: සනානි මන්දිරය, දියතලාව.
අනුරාධපුරය	: අංක 521/21, මෛත්‍රීපාල සේනානායක මාවත, නව නගරය, අනුරාධපුරය.
බදුල්ල	: බී 35-36, පළමු මහල, බස්නැවතුම්පොළ, බදුල්ල.
රත්නපුර	: අංක 32, බස්නැවතුම් පොළ පාර, රත්නපුර.
මාතර	: අංක 43, පරණ තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර.
යාපනය	: අංක 169, කේ.කේ.එස් පාර, යාපනය.
ගාල්ල	: අංක 38 , ඕල්කට් මාවත,ගාල්ල.
මොණරාගල	: අංක 267, වැල්ලවාය පාර, මොණරාගල.
බොරැල්ල	: ආයුර්වේද ජාතික ශික්ෂණ රෝහල, ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත, බොරැල්ල.
ජා ඇල	: අංක 18, කපුවත්ත, ජා ඇළ.
බේරුවල	: පළමු මහල, සමුපකාර මන්දිරය, බේරුවල.
නාරහේන්පිට	: රජවාස, විශේෂ ආර්ථික මධ්‍යස්ථානය, කිරිමණ්ඩල පාර, නාරහේන්පිට.
ඇඹිලිපිටිය	: අංක 87, මොරකැටිය පාර, ඇඹිලිපිටිය.
කිරිබත්ගොඩ	: අංක 06, ජාතික නිවාස යෝජනා ක්‍රමය කිරිබත්ගොඩ.

3.3 විගණකවරු

විගණකාධිපති, අංක: 306/72, පොල්දූවපාර, බත්තරමුල්ල.

3.4 බැංකු

මහජන බැංකුව සහ ලංකා බැංකුව

04. අධ්‍යක්ෂ මණ්ඩලය

1.	නීතිඥ සාගලා අභයවික්‍රම මහත්මිය (2023.05.01 දක්වා)	-	සභාපති
2.	ආචාර්ය අනුර ඇතුලත්මුදලි මහතා (2023.05.02 සිට)	-	සභාපති
3.	නීතිඥ පී. එල්. ජී. එස් කාංචන මහතා	-	කළමනාකාර අධ්‍යක්ෂ
4.	ගීතාමනි සි. කරුණාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5.	චන්ද්‍රිකා සේනාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6.	අචාර්ය එම්. ඩී. ජේ. අබේගුණවර්ධන මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7.	යූ.ජී. ඉන්දික පුෂ්පකුමාර මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8.	එම්.එම්.එස්. පුංචිබණ්ඩාර මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. විධායක නිලධාරී මණ්ඩලය

1.	සභාපති	-	නීතිඥ සාගලා අභයවික්‍රම මහත්මිය (2023.05.01 දක්වා)
2.	සභාපති	-	ආචාර්ය අනුර ඇතුලත්මුදලි මහතා (2023.05.02 සිට)
3.	කළමනාකාර අධ්‍යක්ෂ	-	එල්.ආර්.ඩී.ශාන්ත කුමාර මහතා (2023.01.16 දක්වා)
4.	කළමනාකාර අධ්‍යක්ෂ	-	නීතිඥ පී. එල්. ජී. එස් කාංචන මහතා (2023.01.17 සිට)
5.	සාමාන්‍යාධිකාරී	-	පී.ඩී.ධම්මික මහතා
6.	සහකාර සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලා	-	කේ.ඩී.එම්.ඒ.වන්ද්‍රසේකර මහතා
7.	සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය	-	එම්.ජී. ගයාන් තක්ෂිල මහතා (2023.08.31 දක්වා)
8.	ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	කේ.ඒ.සී.ඩී. කොඩිකාර මහත්මිය
9.	සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය (වැ.බ)	-	කැලුම් පතිරවසම් මහතා (2023.09.01 සිට)
10.	කළමනාකරු - මුදල්	-	කැලුම් පතිරවසම් මහතා
11.	වෛද්‍ය නිලධාරී	-	එම්.කේ.එන්. ගුණසේකර මහත්මිය
12.	කළමනාකරු - සැලසුම්	-	ජගත් කෝරළගේ මහතා
13.	කළමනාකරු - මානව සම්පත්	-	එම්.තිලානි විජේසිංහ මහත්මිය
14.	වෛද්‍ය නිලධාරී	-	ටී.කේ. ලියනගේ මහත්මිය
15.	කළමනාකරු - අලෙවි	-	එච්.එම්.ඩී.ඩී. ධනංජ මහතා
16.	කළමනාකරු - තත්ව පාලන	-	කේ.ඒ.එච්.කේ. කස්තුරිආරච්චි මහතා
17.	කළමනාකරු - කර්මාන්තශාලා	-	බී.ඩී. නවීන් කරුණාසේන මහතා (2023.08.18 දක්වා)
18.	කළමනාකරු - සැපයුම්	-	ඩබ්.ඩී.එස්. දීපනි වන්නිආරච්චි මහත්මිය (2023.02.28 දක්වා)
19.	වෛද්‍ය නිලධාරී - කළමනාකරු - සැපයුම් (වැ.බ)		ඒ.එස්.ඩබ්. සේනාරත්න මහතා (2023.03.01 සිට 2023.11.09 දක්වා)
20.	වෛද්‍ය නිලධාරී	-	වී.එම්.එල්.එස්. නිමලරත්න මහතා
21.	වෛද්‍ය නිලධාරී	-	එච්.විමංග විජේවර්ධන මහතා
22.	වෛද්‍ය නිලධාරී	-	ඩී. ෂෙහාන් රසාද් ද සිල්වා මහතා

අභ්‍යන්තර විගණන අංශය

1.	අභ්‍යන්තර විගණක	-	ඒ.ඩී.එන්.කේ. ප්‍රේමරත්න මහත්මිය

06. කාර්ය මණ්ඩල සංයුතිය


2023 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

තනතුරු නාමය	කාර්යාලය	නිෂ්පාදනාගාරය	ඩිඒරාම අ.ම	නාවින්න අ.ම	මහනුවර අ.ම	දියතලාව අ.ම	බදුල්ල අ.ම	අනුරාධපුරය අ.ම	මාතර අ.ම	රත්නපුර අ.ම	මොණරාගල අ.ම	ගාල්ල අ.ම	බොරැල්ල අ.ම	යාපනය අ.ම	බේරුවල අ.ම	ජා ඇල අ.ම	නිකවැරටිය ඔසු උයන	මදවච්චිය ඔසු උයන	දංගොල්ල ඔසු උයන	ඇඹිලිපිටිය අ.ම	නාරහේන්පිට අ.ම	කිරිබත්ගොඩ අ.ම	එකතුව
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	1	2																					03
කළමනාකරුවන්	5	6																					11
කණිෂ්ඨ කළමනාකරුවන්	9	3																					12
කළමනාකරණ සහකාර සේවා තාක්ෂණික නිලධාරීන්	3	11																					14
කළමනාකරණ සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන්	48	17	1	1	1	1	1	1	1	1	1	1	1	1	1	1	1	-	1	1	1	1	84
ප්‍රාථමික ගණය අර්ධ ශිල්පීය නිලධාරීන්		14																					14
ප්‍රාථමික ගණය ශිල්පීය නිලධාරීන්		10																					10
ප්‍රාථමික ගණය ශිල්පීය නොවන නිලධාරීන්	13	109	1	-	1	1	1	1	1	-	1	1	1	1	2	1	1	1	1	-	1	-	139
කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්	5	41		1						1										1		1	50
ස්ථීර සේවකයින්ගේ එකතුව (1)	**84**	**213**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**3**	**2**	**2**	**1**	**2**	**2**	**2**	**2**	**337**
අනියම් කම්කරු / තාවකාලික කම්කරු/ (දෛනික වැටුප්)		1	1														20	1	18				41
ස්ථීර හා තාවකාලික කම්කරු එකතුව (1)+(2)	**84**	**214**	**3**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**3**	**2**	**22**	**2**	**20**	**2**	**2**	**2**	**378**

07. කාර්ය සාධන


පිරිවැටුම

පසුගිය වසර කිහිපයට සාපේක්ෂව වාර්ෂික පිරිවැටුම වැඩි වී ඇත. එය පසුගිය වසරට සාපේක්ෂව එක වර්ධනයක් පෙන්නුම් කරයි.




නිෂ්පාදනය

නිෂ්පාදනය පෙර වසර හා සඳහන විට 23% ඉක්ම වූ වර්ධනයක් ළඟා කර ගෙන ඇත.



බදු පසු ශුද්ධ ලාභය

පෙර වර්ෂයන්හිදි අලාභදායි තත්ත්වයන් වාර්තා කර තිබුණ ද අමුද්‍රව්‍ය මිලට සාපේක්ෂව නිෂ්පාදන මිල කිරීම, අමුද්‍රව්‍ය මිලදි ගැනීමේදී පිරිවැය අවම කර ගැනීම වැනි සාධක මත ලාභදායකත්වය වර්ධනය කර ගෙන ඇත.



08. සේවක දිරිදීමනා සහ සුභසාධනය

8.1 සේවක දිරි ගැන්වීම්

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පහත සඳහන් දීමනා ලබා දෙනු ලැබේ.

- පැමිණීමේ දිරි දීමනාව
- නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව
- ඵලදායීතා දීමනාව
- වාර්ෂිකව ප්‍රසාද දීමනා
- ඉතිරි වෛද්‍ය නිවාඩු දීමනා

8.2 සේවක සුභසාධනය

අප සංස්ථාවේ සේවක සුභසාධනය සඳහා පහත සඳහන් වැඩ පිළිවෙළ දැනට ක්‍රියාත්මක කර ඇත.

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ වන සියලුම සේවකයින්, අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සහ රියදුරන් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.
- සියලුම සේවකයින්ට උදෑසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දීම සහ රාත්‍රී සේවය කරන ලද සේවකයින් වෙත රාත්‍රී ආහාර සැපයීම.
- අවමංගල්‍ය අවස්ථාවලදී සේවකයන් වෙත ලබාදෙන පාංශුකූල දීමනාව ලෙස රු.6,500.00ක් ලබා දීම.
- සිංහල හා හින්දු අළුත් අවුරුදු සැමරුම් වෙනුවෙන් අප්‍රේල් මස දී සෑම සේවකයෙකු සඳහාම රු.6,500.00ක තෑගි වවුචර්යක් ලබා දීම.

8.3 ආයතනික සමාජ වගකීම

ආයතනික සමාජ වගකීම වෙනුවෙන් අදාල අනුමත සීමාවන් යටතේ සංස්ථාවේ ඖෂධ මංජුසා ලබා දීම සහ විවිධ රාජ්‍ය සහ ඒ හා සම්බන්ධ උත්සව සඳහා පැමිණෙන ජනතාව වෙත ඔසු පැන් ලබා දීම සිදු කර ඇත.

09. ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.

	ඖෂධ නාමය	ඒකකය	2023	2022	2021	2020	2019
1	අරිෂ්ට	750ml	93,527	49,706	87,385	97,084	108,603
2	ආසව	750ml	72,706	43,560	71,010	75,174	96,920
3	ක්වාථ	750ml	91,805	91,540	104,249	108,655	81,733
4	සිරප්	750ml	20,995	15,233	11,949	23,616	27,458
5	තෛල	750ml	218,000	175,376	207,305	160,621	198,599
6	චූර්ණ	1 kg	29,884	23,032	27,417	24,422	25,666
7	කල්ක	1 kg	9,608	6,620	11,639	7,247	11,144
8	ලේහ	1 kg	3,645	797	3,178	2,215	4,078
9	ලේප	1 kg	10,171	7,419	8,359	8,021	6,488
10	මෝදක	1 kg	3,272	2,494	3,832	2,153	1,099
11	රස	1 kg	2,401	1,900	2,199	1,570	2,131
12	ගුගුල්	1 kg	7,447	5,689	7,103	7,038	7,854
13	වටිකා	1 kg	7,064	4,506	5,997	4,851	7,783
14	වයින්	750ml	-	-	-	-	-
15	New Products Main Factory	1 kg	6,826	9,078	46,306	21,552	5,555
16	New Factory Products (kg)	1 kg	5,907	5,957	9,451	6,670	7,218
17	New Factory Products (L)	1L	26,846	24,347	25,251	20,432	14,037
18	Re Fill Item	750ml	8,223	8,215	16,356	5,485	4,133
19	**New Products (PACK)**						
	(1) OUSHADHA MANJUSA SPECIAL PACK	NOS		-	400		
	(2) SANSTHA ESSENTIAL OIL PACK	NOS	99				
	(3) SANSTHA FIRST AID BOX	NOS	49				

10. රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ .

(රු. මිලියන)

	2023 වර්ෂය	**2022** වර්ෂය	**2021** වර්ෂය	**2020** වර්ෂය	**2019** වර්ෂය
රාජ්‍ය අංශය	962.41	730.34	593.61	517.46	585.63
අලෙවි මධ්‍යස්ථානය					
විජේරාම අලෙවි මධ්‍යස්ථානය	13.32	9.86	9.38	7.22	5.90
ජංගම අලෙවිය	6.29	19.71	45.76	22.85	20.75
මහනුවර අලෙවි මධ්‍යස්ථානය	9.09	9.87	9.15	9.60	8.27
දියතලාව අලෙවි මධ්‍යස්ථානය	4.82	5.39	4.98	4.03	2.66
අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය	14.21	11.29	7.22	14.96	17.11
බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	5.99	6.48	4.92	4.68	4.18
පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය	-	1.94	3.55	4.03	4.24
නාවින්න අලෙවි මධ්‍යස්ථානය	37.85	33.21	32.59	26.04	10.67
අංක 008 ගබඩාව	44.52	13.90	9.58	4.89	0.46
රත්නපුර අලෙවි මධ්‍යස්ථානය	9.85	6.78	5.33	4.83	4.01
යාපනය අලෙවි මධ්‍යස්ථානය	15.82	12.22	12.05	11.78	7.69
ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	14.27	9.84	8.99	6.48	5.03
සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය	-	-	-	1.38	1.85
මොණරාගල අලෙවි මධ්‍යස්ථානය	6.42	6.60	7.78	5.46	3.67
මාතර අලෙවි මධ්‍යස්ථානය	14.05	9.11	10.74	9.47	6.14
බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය	14.17	10.53	7.73	8.09	7.73
මාතලේ අලෙවි මධ්‍යස්ථානය	-	1.72	3.61	3.90	3.51
අළුත්ගම අලෙවි මධ්‍යස්ථානය	-	-	-	1.07	3.00
ජා ඇළ අලෙවි මධ්‍යස්ථානය	8.09	8.99	7.13	2.26	2.46
බස්නාහිර පළාත් අලෙවි මධ්‍යස්ථානය	-	2.51	5.44	3.92	0.68
බේරුවල අලෙවි මධ්‍යස්ථානය	10.57	7.97	7.60	1.89	-
නාරහෙන්පිට අලෙවි මධ්‍යස්ථානය	6.17	4.22	1.98	-	-
කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	9.37	3.96	-	-	-
ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය	8.25	9.47	1.14	-	-
මුළු එකතුව	**1,215.53**	**935.91**	**800.26**	**676.29**	**705.64**

11. ආදායම බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)

	2023	2022	2021	2020	2019
විකුණුම්	100.00	100.00	100.00	100.00	100.00
අඩු කළා :- විකුණුම් පිරිවැය	62.23	77.25	76.19	69.77	68.77
දළ ලාභය	37.77	22.75	23.81	30.23	31.23
එකතු කළා - වෙනත් ආදායම්	3.47	3.56	3.23	1.28	2.12
එකතුව	41.25	26.32	27.04	31.52	33.35
අඩු කළා					
ආයතන හා පරිපාලන වියදම්	14.61	19.76	19.11	19.98	21.37
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	10.03	11.06	10.45	11.88	12.94
මූල්‍ය වියදම්	0.30	0.46	1.28	0.82	0.90
මුළු වියදම	24.94	31.28	30.84	32.67	35.21
මෙහෙයුම් ලාභය	16.31	(4.96)	(3.80)	(1.16)	(1.86)
එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම්	1.63	2.20	1.59	2.56	2.30
බදු අඩු කිරීමට පෙර ලාභය	17.95	(2.76)	(2.22)	1.40	0.45
අඩු කළා					
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	6.33	0.06	-	0.50	0.35
ශුද්ධ ලාභය	**11.62**	**(2.82)**	**(2.22)**	**0.90**	**0.09**

12. ලාභ දායකත්වය (රු. මිලියන වලින්)

(රු. මිලියන)

	2023	2022	2021	2020	2019
විකුණුම්	1,215.28	935.89	800.22	676.30	705.62
අඩු කළා :- විකුණුම් පිරිවැය	756.21	722.94	609.65	471.83	485.23
දළ ලාභය	459.07	212.95	190.57	204.47	220.39
එකතු කළා - වෙනත් ආදායම්	42.22	33.36	25.82	8.69	14.94
මුළු ආදායම	501.29	246.31	216.39	213.16	235.33
අඩු කළා					
ආයතන හා පරිපාලන වියදම්	177.49	184.92	152.91	135.10	150.80
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	121.89	103.53	83.63	80.34	91.28
මූල්‍ය වියදම්	3.68	4.29	10.27	5.54	6.37
මුළු වියදම	303.06	292.74	246.81	220.98	248.45
මෙහෙයුම් ලාභය/අලාභය	198.23	(46.43)	(30.42)	(7.82)	(13.12)
එකතු කළා - පොළී ආදායම්	19.86	20.64	12.70	17.28	16.26
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	(76.88)	(0.59)	-	(3.36)	(2.50)
ශුද්ධ ලාභය/අලාභය	**141.21**	**(26.38)**	**(17.72)**	**6.10**	**0.64**

13. තිරසාර සංවර්ධනය අරමුණු සාක්ෂාත් කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් 2015 වර්ෂයේ දී එකඟ වී ඇති තිරසාර සංවර්ධන අරමුණු මූලික කරගත්, වර්ෂ 2030 දී සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් ඉලක්ක කර ඇති පහත සඳහන් අරමුණු සඳහා 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සෘජු දායකත්වයක් දක්වා ඇත.

1. වන අරමුණ - දරිද්‍රතාවයෙන් තොර වීම.
2. වන අරමුණ - කුසගින්න තුරන් කිරීම.
3. වන අරමුණ - නීරෝගී බව හා යහපැවැත්ම.
4. වන අරමුණ - සුනිසි මෙහෙවර හා ආර්ථික වර්ධනය.
5. වන අරමුණ - වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය.

14. නිෂ්පාදනය වැඩි කිරීම

- **අමුද්‍රව්‍ය සපයා ගැනීම**

පසුගිය වසර කිහිපය තුළදී රට තුළ පැවති ව්‍යාවසන හා ආර්ථික අර්බුද හමුවේ අමුද්‍රව්‍ය සැපයීම මිල විශාල වශයෙන් ඉහළ ගොස් නිෂ්පාදන පිරිවැය පාලනය කළ නොහැකි ආකාරයෙන් වැඩි වී තිබුණි. ඒ සඳහා කළමනාකරණ ක්‍රම සහ ප්‍රසම්පාදන ක්‍රම කාලෝචිතව වෙනස්කරමින්, සැපයුම්කරුවන් අතර තරහකාරිත්වය වර්ධනය කරමින් සහ නව කරහකාරී සැපයුම්කරුවන් සැපයුම් ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම තුළින් අවම මිල ගණන් යටතේ අඛණ්ඩ සැපයුමක් සිදු කර ගැනීමට හැකි විය.

විශේෂයෙන්ම අමු ද්‍රව්‍ය සපයා ගැනීමේදී එක් එක් අමු ද්‍රව්‍ය සඳහා සැපයුම්කරුවන් විසින් පවත්වාගෙන යන ලද ඒකාධිකාරී ස්වරූපය බැහැර කිරීමට සංස්ථාවේ කලමනාකාරිත්වය කටයුතු කර ඇත.

15. ඔසු උයන් පාලනය

- **නිකවැරටිය ඔසු උයන**

  මුළු භූමි ප්‍රමාණය අක්කර 50ක් පමණ වන අතර නික, තොටිල, කිරාත, කහ, අඩතොඩ, සැවැන්දරා, සහ කොමාරිකා වැනි ඖෂධ වගා කර ඇත.

  මෙම ඔසු උයනෙහි පවත්වාගෙන යනු ලබන කාර්යාල ගොඩනැගිල්ල 2023 වර්ෂයේදී අළුත්වැඩියා කර ඇත. එමෙන්ම ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවති.



නික



ආඩතෝඩා



කහ



ඉරිවෙරිය



බුලත්



අළු කෙසෙල්

- **දංගොල්ල ඔසු උයන**

අක්කර 35ක පමණ භූමියක අක්කර 15කට ආසන්න ප්‍රමාණයක් මුං ඇට, උඳු, කොල්ලු, හීං අරත්ත, තල, කිරාත වැනි කෙටි කාලීන බෝගද තවත් අක්කර 15කට ආසන්න භූමි ප්‍රමාණයක අරළු, බුළු, නෙල්ලි, බෙලි, පලොල්, ඇඹුල් දොඩම් වැනි දිර්ඝ කාලීන බෝග ද වගා කර ඇත.

මෙම ඖෂධ වගාවන්හි ඵලදාව ප්‍රධාන කාර්යාල වෙත එවනතෙක් ගබඩා කර ගැනීමේ පහසුකම් පුළුල් කිරීම සඳහා වර්ග අඩි 400ක පමණ ගබඩාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත.



මුං ඇට



උඳු



තල



කිරාත



කොල්ලු

- **මැදවච්චිය ඔසු උයන**

අක්කර 5½ක පමණ භූමි ප්‍රමණයක් සහිත මෙම ඔසු උයනෙහි මස් බැද්ද, අත්තන, පොල්, කුඹුක්, මී, බුළු වැනි බෝග සිටුවා නඩත්තු කරනු ලබයි.

16. නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීම

- **ප්‍රාග්ධන ව්‍යාපෘති**

අර්ධ ස්වයංක්‍රිය තාප හැකිලීමේ ඇසුරුම් යන්ත්‍ර (Heat Shrink Packing Machines)

ආයතනයේ අනවශ්‍ය පිරිවැය ඉවත් කිරීමේ අරමුණින් මෙතෙක් නිෂ්පාදනයන් ඇසුරුම් කරන ලද කාඩ්බෝඩ් පෙට්ටි (corrugated Box) වෙනුවට shrink wrapping ඇසුරුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය මෙම යන්ත්‍ර 02 ප්‍රධාන නිෂ්පාදනාගාරයේ සහ නව නිෂ්පාදනාගාරයේ ස්ථාපනය කර ඇත. මෙමඟින් වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු වේ.



17. නව නිෂ්පාදන හඳුන්වාදීම සහ අලෙවි ප්‍රවර්ධනය


- **නව නිෂ්පාදන හඳුන්වා දීම**

ඖෂධ සංග්‍රයේ ඇති පහත සඳහන් නිෂ්පාදන කිහිපයක් එළි දැක්වීමට අප සංස්ථාව කටයුතු කරන ලදි.

- අරළු පෙති
- සුවධරණී කැප්සියුල්
- පංචමූල ලඝු ද්‍රාක්ෂා කෂාය පෙති
- ඒරණ්ඩ සප්තක කෂාය පෙති
- දන්තිමූලාදී කෂාය පෙති
- සංස්ථා Frist aid Box
- සංස්ථා Oil pack
- තැවිලි පොට්ටනිය (නාරායන/පිණ්ඩ/නිර්ගුණ්ඩියාදී)
- කාංචනාර ගුග්ගුලු - (ග්‍රෑම් 250)
- ජාතිඵලාදී චූර්ණය- (ග්‍රෑම් 500)

ආයුර්වේද ක්ෂේත්‍රයේ පෙර ගමන්කරු වශයෙන් පාරිභෝගිකයා ආකර්ෂණය කර ගැනීම සඳහා ඇසුරුම් වඩාත් ආකර්ෂණීය ලෙස Blister Pack ආකාරයෙන් ඇසුරුම්කර වෙළඳපලට නිතුක් කිරීමට මෙම වර්ෂයේදී අප කටයුතු කර ඇත. මෙමඟින් නව වෙළඳපළක් ආකර්ෂණය කර ගැනීමටත්, එමඟින් අලෙවිය පුළුල් කර ලාභ උපරිම කර ගැනීමටත් අප කටයුතු කර ඇත.






කාංචනාර ගුග්ගුලු - (ග්‍රෑම්250) ජාතිඵලාදී චූර්ණය- (ග්‍රෑම් 500)



තැවිලි පොට්ටනිය - පිණ්ඩ





සංස්ථා Frist aid Box





අරළු පෙති සංස්ථා Oil pack

- **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

රජය සහ රජයටඅනුබද්ධිත ආයතන සහ ජනතාව දැනුවත් ගැවසෙන ස්ථාන ආවරණය වන පරිදි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 2023 වර්ෂයේදී සංවිධානය කර ඇත.

මාසය	අලෙවි මධ්‍යස්ථානය	ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වූ දිනය	පැවැත්වූ ආයතන පරිශ්‍රය	ශුද්ධ ආදායම
ජනවාරි	දියතලාව අලෙවි මධ්‍යස්ථානය	2023.01.25	හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	7,060.00
	බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.01.25	බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	9,810.00
	මාතර අලෙවි මධ්‍යස්ථානය	2023.01.25	මාතර තැපැල් කාර්යාලය	4,925.00
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.01.26	නැව් සංස්ථාව	46,705.00
පෙබරවාරි	බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.02.22/23	දියත උයන පරිශ්‍රය	140,468.50
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.02.14	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	104,425.50
මාර්තු	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.03.03/04/05	ජාතික සුවසේවා මධ්‍යස්ථානය	287,235.00
	රත්නපුර අලෙවි මධ්‍යස්ථානය	2023.03.04/05/06	ශ්‍රී පාදස්ථානය	85,961.00
	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.03.18	පැලියගොඩ ජයතිලකාරාමය	15,673.50
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.03.24	මුදල් අමාත්‍යාංශය	35,464.50
	විජේරාම අලෙවි මධ්‍යස්ථානය	2023.03.24	ජාතික රූපවාහිනී පරිශ්‍රය	15,174.00
	බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.03.28	හෝමාගම උසාවිය	25,500.00
අප්‍රේල්	මහනුවර අලෙවි මධ්‍යස්ථානය	2023.04.07/08/09/10/11	කැන්ඩි සිටි සෙන්ටර්	73,507.50
	ජා ඇල අලෙවි මධ්‍යස්ථානය	2023.04.22	අළුත් අවුරුදු උත්සවය	1,110.00
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.04.27	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	12,348.00
මැයි	බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.05.25	ඌව පළාත් සභාව	8,450.00
	ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.05.26	කඩවත් සතර ප්‍රා දේශීය ලේකම් කාර්යාලය	21,195.00
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.05.26	නැව් සංස්ථාව	75,024.00
	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.05.29	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	12,532.50
	මාතර අලෙවි මධ්‍යස්ථානය	2023.05.29	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	13,392.50
	මහනුවර අලෙවි මධ්‍යස්ථානය	2023.05.29	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	7,236.00
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.05.30	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොලඹ	18,126.00

	බේරුවල අලෙවි මධ්‍යස්ථානය	2023.05.25	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බේරුවල	12,530.00
	දියතලාව අලෙවි මධ්‍යස්ථානය	2023.05.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දියතලාව	6,235.00
	මාතර අලෙවි මධ්‍යස්ථානය	2023.05.25	ජල සම්පාදන මණ්ඩලය	11,821.50
ජූනි	අනුරාධපුර අලෙවි මධ්‍යස්ථානය	2023.06.14	බස්නැවතුම්පොල	5,070.00
	ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය	2023.06.26	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇඹිලිපිටිය	7,680.00
ජූලි	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.07.26	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	62,518.50
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.07.28	සෙත්සිරිපාය	82,030.50
	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.07.26	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	7,947.00
	ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.07.26	ගාල්ල මහ නගර සභාව	11,520.00
	මාතර අලෙවි මධ්‍යස්ථානය	2023.07.26	මාතර ජලසම්පාදන මණ්ඩලය	6,102.00
	දියතලාව අලෙවි මධ්‍යස්ථානය	2023.07.26	දියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	8,200.00
	බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	2023.07.26	බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	12,180.00
	මොණරාගල අලෙවි මධ්‍යස්ථානය	2023.07.29	විපුලානන්ද විද්‍යාලය	1,280.00
අගෝස්තු	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.08.28	සෙත්සිරිපාය	30,240.00
	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.08.28	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	1,548.00
	ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය	2023.08.28	ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	8,190.00
සැප්තැම්බර්	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.09.08/09/10	බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව	490,563.00
	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.09.29/30	කිරිල්ලවල විද්‍යාලය	15,246.00
	මහනුවර අලෙවි මධ්‍යස්ථානය	2023.09.01/02/03	සහස් උයන	20,701.00
ඔක්තෝම්බර්	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.10.31	කිරිල්ලවල විද්‍යාලය	12,469.00
	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.10.25/26	නැව් සංස්ථාව	104,481.00
දෙසැම්බර්	නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය	2023.12.22	මුදල් අමාත්‍යාංශය	23,463.00
	කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	2023.12.22/23/24	කිරිබත්ගොඩ නගරය	16,410.00
	මුළු ආදායම			1,979,749.00

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - විගණන කමිටු වාර්තාව - 2023

2010/12/14 දිනැති අංක පී.ඊ.ඩී 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනයේ විගණන කමිටුව පිහිටුවා ඇත.

එම චක්‍රලේඛය අනුව විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කරගැනීම, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි, පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම, රජය විසින් නිකුත් කරන ලද නීති, රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට ඇති අනුකූලතාවය සමාලෝචනය කිරීම, ඇගයීම හා අනුකූල නොවීම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය යුතුවේ.

ආයතනයේ විගණන කමිටුව භාණ්ඩාගාර නියෝජිත ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත වූ අතර විගණන කමිටුවේ සභාපතිත්වය දරණු ලබන්නේ භාණ්ඩාගාර නියෝජිත වන අධ්‍යක්ෂවරයාය.

විගණන කමිටු රැස්වීම් සඳහා ජාතික විගණන කාර්යාලයෙන් විගණන අධිකාරීවරයෙකු නිරීක්ෂක ලෙස සහභාගී විය.

දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එස්.අයි.සී. තුෂාරිකා මිය දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී වූ අතර 2023.08.16 දින සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී විය.

විගණන කමිටුවේ ලේකම් ලෙස ආයුර්වේද සංස්ථාවේ අභ්‍යන්තර විගණක කටයුතු කරන අතර විගණන කමිටුවට වාර්තා ඉදිරිපත් කිරීම හරහා විගණන කමිටුවට සහය වනු ලබයි.

විගණන කමිටුවේ ආරාධනය මත ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය විගණන කමිටු රැස්වීම් වලට සහභාගී විය.

2023 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් හතරක් (4ක් (2023.01.03, 2023.04.16, 2023.08.16 හා 2023.12.19 දිනයන්හිදී) පවත්වා ඇති අතර කමිටු සභාපති, නිරීක්ෂකයන් හා සාමාජිකයන් නියමිත සනපූර්ණය සහිතව විගණන කමිටුවට සහභාගී වී ඇත.

2023 වර්ෂය තුළ කමිටුව විසින්,

- බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු සම්බන්ධයෙන් අදාළ අංශ ප්‍රධානීන්ගේ පිළිතුරු අවධානයට යොමු කර ඒවා නිවැරදී කිරීම සඳහා අදාළ කළමනාකාරිත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සැළකිල්ලට ලක්කර ඇත.
- ආයතනයේ කාර්යන් කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් පවත්වාගෙන යාම සඳහා ආයතනයේ විවිධ ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණාත්මකභාවය පිළිබඳ විමර්ශණය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ සම්බන්ධයෙන් , අදාළ අංශ ප්‍රධානීන් විසින් ගෙන ඇති පසු විපරම් කටයුතු පිළිබඳ අවධානය යොමු කිරීමත්, එම නිර්දේශ ක්‍රියාත්මක නොකරන නිළධාරීන් සම්බන්ධයෙන් දිරි දීමනා අත්හිටුවීමටත් නිර්දේශ කර නිළධාරීන්ගෙන් අපෙක්ෂිත කාර්ය සාධනය ලභා කර ගැනීමට කටයුතු කර ඇත.
- 2022 හා 2023 වර්ෂයන් තුළ ජාතික විගණන කාර්යාලය මඟින් නිකුත් කරන ලද විගණන විමසුම් හා විගණකාධිපති වාර්තාවන් පිළිබඳ අවධානය යොමු කර පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් හා ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.

ආයතනයේ සියලු අංශ සම්බන්ධ වන පරිදි, වැරදි වංචා අවම කිරීමටත් නිවැරදි තීරණ ගැනීම සඳහා තොරතුරු වලට පිවිසීමටත් හැකි වන පරිදි, පරිසනක පද්ධතියක් හඳන්වාදීමටත් නිර්දේශ ලබා දී ඇත.

- ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදීමට හා ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දී ඇත.
- ආයතනයේ අවධානම් කළමනාකරණය සඳහා අවධානම් කමිටුවක් (Risk Committee) පත් කිරීම සඳහා නිර්දේශ ලබා දුන් අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ අවධානම් කමිටුවක් පිහිටුවීමට කටයුතු කර ඇත.
- ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවීම සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියක් හා විගණන හා කළමනාකරණ කමිටුව මෙහෙයවීම සඳහා විගණන කමිටු ප්‍රඥප්තියක් නිර්දේශ කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.
- 2023 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා විගණන සැලැස්ම එකිනෙකට අනුගතවන ලෙස සකස් කර නියමිත දිනදී ඉදිරිපත් කිරීමට හා ක්‍රියාත්මක කිරීමටත්, එමඟින් ආයතනයෙහි කාර්ය සාධනය ඉහළ නැංවීමටත් ඉහළ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කර ඇත.

විගණන කමිටු සංයුතිය

01. චන්ද්‍රිකා සේනානායක මිය	- භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති)
02. ගීතාමනි සී. කරුණාරත්න මිය	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික)
03. ප්‍රදිප් ඒ පීරිස් මහතා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික)
04. එස්. අයි. සී. තුෂාරිකා මිය	- ප්‍රධාන ගණකාධිකාරී (සෞඛ්‍ය අමාත්‍යාංශය)(කමිටු සාමාජික)
05. ආර්. එම්. එස්. වසන්තා මිය	- ප්‍රධාන අභ්‍යන්තර විගණක (සෞඛ්‍ය) (කමිටු සාමාජික)
06. කේ. කන්දගේ මහතා	- රජයේ විගණන අධිකාරි - (කමිටු නිරීක්ෂක)

- 2023.08.16 දින සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී විය.

චන්ද්‍රිකා සේනානායක
කමිටු සභාපති
2024.01.09

ස්තුතිය

- නිවැරදි මහ පෙන්වීමක් කළ හිටපු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාටත්, සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාටත්, දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු නීතිඥ සිසිර ජයකොඩි මැතිතුමාටත්,
- දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සංස්ථාවේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා සහාය දුන් මහා භාණ්ඩාගාරයටත්,
- නොමද සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත් පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මහපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමු.



ආචාර්ය අනුර ඇතුලත්මුදලි
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මඟින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (රජය සහ ප්‍රජාව, ආයේජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

- **අධ්‍යක්ෂ මණ්ඩලය**

අධ්‍යක්ෂ මණ්ඩලය, නිෂ්පාදනය, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ආශ්‍රිත සේවා, අලෙවිකරණය, රාජ්‍ය මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි ව්‍යාප්තිමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

- **කළමනාකරණ කමිටුව**

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරන ආකාර, උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මඟින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

- **විගණන කමිටුව**

“ යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ“ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපති වේ. සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලබන අතර අවශ්‍ය අවස්ථා වලදී කළමනාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීම. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන අතර අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන කටයුතු විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ

- **ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම**

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම ආයතනවලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරි බලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුව පවතින බැවින් ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

ලාභ අරමුණු කර ගත් රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වග කියනු ලැබේ.

- **වේතන ප්‍රතිපත්තිය**

සංස්ථාවේ වැටුප් ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් සහ චක්‍රලේඛ මත පිහිටුවා සකසා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල දීමනා, මුදල් අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සංස්ථා වලට අදාළව නිකුත්කර ඇති චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

මාසික නිෂ්පාදනය හා සේවක පැමිණීම පාදක කර ගනිමින් නිෂ්පාදන සහ පැමිණීමේ දිරිදීමනා සියලුම සේවකයන් වෙත මාසිකව ගෙවනු ලබයි.

- **අභ්‍යන්තර පාලනය**

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම හා වාර්තා කිරීම, නිර්දේශ කිරීම, සහතික කිරීම සහ අනුමත කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති.

කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරි, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. සංස්ථාව් ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරි වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සෘජුවම වාර්තා කරයි.

අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තහවුරු කර ඇති අතර අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. රජයේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික විගණන වාර්තාව මත පදනම්ව ඒ ඒ අංශවල පවත්නා දුර්වලතා මහහරවා ගැනීමට, සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය සහ විගණන කමිටුවේ අවශ්‍ය මගපෙන්වීම් සිදු කරනු ලබයි.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන සහ ඒ හා සම්බන්ධ චක්‍රලේඛන මත පදනම්ව සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය තහවුරු කිරීමට ඒ ඒ මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ඇත.

අපේක්ෂිත අදායම්, පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MED/A/ADC/FA/23/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ජූනි 25 දින

සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශනය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ නොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාඛණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිත වලින් අවසර දී ඇති විටක හැර අස්ථිත්වයක් වත්කම සහ වගකීම් හෝ අදායම සහ වියදම් හිලව නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ආදායම රු.19,864,257ක් හා මූල්‍ය වියදම රු.3,677,297ක් එකිනෙකට හිලව් කර රු.16,186,960 ක ශුද්ධ වෙනස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 25 ඡේදය ප්‍රකාරව සංස්ථාවේ නිමි නොග සම්බන්ධයෙන්, ප්‍රථමයෙන් ලැබීම ප්‍රථමයෙන් නිකුත් කිරීම ක්‍රමයට නොග ලෙජර පවත්වා නිබුණද එම නොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම නිරූ යාවත්කාලීන කර නොතිබුණු අතර වර්ෂය අවසානයේ නොග ලෙජරයේ ඉතිරි ඒකක සංඛ්‍යාව, පසුව ගණනය කරන ලද ඒකක නිෂ්පාදන පිරිවැයනින් වැඩිකර 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ නොගයේ අගය රු.452,862,514 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර නිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ ප්‍රධාන මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම වලින් ජනනය වන මුදල් ප්‍රවාහ මෙහෙයුම් ක්‍රියාකාරකම වලින් පැනනගින මුදල් ප්‍රවාහයන් ලෙස වාර්තා කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලාභයට ඇතුලත් නොවන

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

බැවින් මුදල් සංචලනයට බල නොපාන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් කපාහැරීම රු.2,703,280 ක්, ප්‍රත්‍යාගණන සංචිතයේ වැඩිවීම රු.3,419,894ක් හා පෙර වර්ෂයේ ගැලපුම රු.4,436,074ක් මෙහෙයුම් ක්‍රියාකාරකම වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයට කාරක ප්‍රාග්ධන වෙනස් වීම යටතේ ගලපා නිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 16 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිලිගත් වත්කමක අදායම් හා වියදම් වශයෙන් පැනනගින මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට බල නොපාන ස්ථාවර තැන්පතු නල් පිරිමට පෙර ආපසු ගැනීම් හේතුවෙන් අහිමිවූ රු.2,506,031ක පොලිය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දක්වා නිබුණි. තවද ඉකුත් වර්ෂයේ යන්ත්‍රයක් මිලදී ගැනීමට වැය කළ රු.1,000,000ක් වැරදී ලෙස කෙරිගෙන යන වැඩ ගිණුමට හර කිරීමෙන් සිදු වූ වරද නිවැරදි කිරීම මගින් හට ගත් වෙනස සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට බල නොපාන නමුත් එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස වාර්තා කර නිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 17 (ඇ) ඡේදය ප්‍රකාරව ලබා ගත් ණය මුදල් ආපසු ගෙවීම මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු බැවින් සමාලෝචිත වර්ෂයේ බැංකු ණය වාරික ගෙවීම රු.4,000,000ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වුවත්, එම මුදල් ගලායාම රු.4,333,333ක් ලෙස රු.333,333 ක් වැඩියෙන් දක්වා නිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 21 ඡේදය ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් වලින් පැන නගින දළ මුදල් ලැබීම් හා දළ මුදල් යෙදවීම් වෙන වෙනම වාර්තා කළ යුතු වුවද ස්ථාවර තැන්පතු ගිණුම් 03ක් අවසන් කිරීමෙන් ලද රු.82,036,705ක් හා නව ස්ථාවර තැන්පතු ගිණුම් 03ක තැන්පත් කරන ලද රු.82,000,000 ක් වෙන වෙනම වාර්තා නොකර ශුද්ධ පදනම් මත වාර්තා කර නිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 33 ඡේදය ප්‍රකාරව ගෙවූ පොළී සහ ලැබූ පොළී ආයෝජන මත වූ ප්‍රතිලාභයක් වන අවස්ථාවක ආයෝජන මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මුදලින් ලද පොලි ලැබීම් රු.12,220,977ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස වාර්තා කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරන ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, ඉකුත් වර්ෂයේ පිරිවැය රු.41,010,767 ක්වූ වාහන 27කින් පිරිවැය රු. 37,573,800 ක්වූ වාහන 18 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර නිබුණි. පසුව, ප්‍රත්‍යාගණනය නොකරන ලද මෝටර් රථ 09 කළමනාකරණයේ නිර්දේශයක් අනුව පිරිවැයට නැවත අගයකර ගිණුම්ගත කර නිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර, ඇස්තමේන්තුගත දෝෂ හඳුනාගෙන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු නොකර, සම්පූර්ණයෙන් ක්ෂය කර නිබුණු පිරිවැය රු.99,484,716 ක්වූ යන්ත්‍රෝපකරණ අයිතම 171 ක්, ජල සැපයුම් උපකරණ අයිතම 06 ක්,රසායනාගාර උපකරණ අයිතම 17 ක් හා ඉන්වෙන්ට්‍රි අයිතම 229ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් නිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කිරීම මගින් පැන නැඟුණු රු.2,539,023ක පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් හා ආදායමක් ලෙස දැක්වීමෙදී ආදායම් මූල්‍ය ආදායම් යටතේද වියදම් පරිපාලන වියදම් යටතේද අපැහැදිලි ලෙස දක්වා නිබුණි.

(ඔ) ගබඩාවේ නොතිබුණු ඔසු අමුද්‍රව්‍යයක් නොග ඇඟයීම් ලේඛනයේ දැක්වීමෙන් අමුද්‍රව්‍ය තොගය රු.91,525කින් වැඩියෙන් ගිණුම්ගත කර නිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හානිවූ හා කල් ඉකුත් තොගයේ තථ්‍ය වටිනාකම රු. 6,996.583ක් වූවද, ඒ වෙනුවෙන් ඌණ වෙන් කිරීම රු. 26,725ක් විය. 2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් වූ රු.1,056,100ක අධි වෙන් කිරීමක් හා රු.4,215,118ක ඌණ වෙන් කිරීමක් හඳුනාගෙන නිබුණද ඒ සඳහා අදාළ ගැලපීම් සිදුකර නොනිබුණි.

(ක) ආයුර්වේද කොමසාරිස්වරයා විසින් "ආයුර්එක්ස්"(AyurEx) 2023 අන්තර්ජාතික ප්‍රදර්ශනය වෙනුවෙන් අනුග්‍රහක දායකත්වය ලබා ගැනීම සඳහා 2023 ජූලි 28 දිනැති ලිපිය මඟින් ඉල්ලීම් කර නිබුණු අතර ඒ සඳහා 2023 අගෝස්තු 10 දිනැති අංක 14478 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය සුභසාධක සංගමයේ අංක 167-1001-7317-0353 දරන මහජන බැංකු පුරහල ශාඛා ගිණුම වෙත රු.5,000,000 ක් ගෙවා නිබුණි. තවද ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වූ ආයුර්වේද කොමසාරිස්වරයා විසින් කරන ලද ඉල්ලීමට අනුව ගෙවන ලද එම මුදල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාරව සම්බන්ධිත පාර්ෂව ගණුදෙනු යටතේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොනිබුණි.

(ග) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නිබුණු නිෂ්පාදන ගිණුමට අනුව නිෂ්පාදන පිරිවැය රු.1,059,361,507ක් වූවද, ඒකක නිෂ්පාදන පිරිවැය මත කාර්තු පදනමෙන් පිළියෙල කර නිබුණු නිෂ්පාදන පිරිවැය වාර්තා අනුව මුළු නිෂ්පාදන පිරිවැය රු.643,931,284ක් වූයෙන් වෙනස රු.415,430,223ක් විය. මෙම පිරිවැය විචලනයන් පිළිබඳ පසු විපරමක් කර නොනිබුණු අතර නිෂ්පාදන පිරිවැය වාර්තාවේ සඳහන් ඒකක නිෂ්පාදන පිරිවැය පදනම් කර ගනිමින් ඖෂධ වල විකුණුම් මිල තීරණය කර නිබුණු බැවින් සත්‍ය නිෂ්පාදන පිරිවැය විකුණුම් මිල මඟින් ආවරණය නොවීමේ අවදානම් සහගත තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

(ච) 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් අදාල භාණ්ඩ සංස්ථාව වෙත ලැබී නිබුණද ඊට අදාල බිල්පත් නොපියවීම මත රු.8,362,165ක ශේෂයක් වූ අතර මෙම ශේෂය තුළ 2023 ජනවාරි 01 දින වන විට නොපියවන ලද රු.2,680,842ක ශේෂයක්ද විය. මේ අනුව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වියදම් පිළිවෙලින් රු.2,680,842ක් හා රු.5,681,323ක්ද අඩුවෙන්ද, පිළිවෙලින් එම ප්‍රමාණයෙන් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ණයහිමියෝ වැඩියෙන්ද දක්වා නිබුණි.

(ජ) 2024 ජනවාරි 08 දිනැති මහජන බැංකුවේ ශේෂ සනාථ ලිපිය ප්‍රකාරව 2015 හා 2019 වර්ෂවල විවෘත කරන ලද ණයවර ලිපි ආන්තික ගිණුම් 03ක ශේෂ එකතුව රු.1,951,492ක් වූවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.105,908,646ක් ලෙස රු.103,957,154ක් වැඩියෙන් දක්වා නිබුණි. තවද ඉකුත් වර්ෂයේ ණයවර ලිපි ආන්තික ගිණුමේ ශේෂය රු.25,037,906 ක් වැඩියෙන් දැක්වීම නිරවුල් කිරීමටද කටයුතු කර නොනිබුණි.

(ට) බැංකු සැසඳුම්වල දක්වා නිබුණු බැංකු ගිණුම් 03 කට සෘජුවම ලැබී නිබුණු වර්ෂයකටත් වඩා පැරණි රු. 2,445,597 ක් වූ මුදල් හා චෙක්පත් නිශ්චිතව හඳුනාගෙන පොත්වලට ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ඩ) 2008 වර්ෂයේ හා ඊට පෙර සංස්ථාවේ රසායනාගාර කටයුතු සඳහා පිළිවෙලින් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හා ආයුර්වේද පර්යේෂණ ආයතනයෙන් ලැබී නිබුණු රු. 3,994,341 ක හා රු.761,274 ක පරිත්‍යාග වාර්ෂිකව ක්‍රමක්ෂය ගිණුම්ගත කිරීම හරහා ආදායමට හඳුනා නොගෙන බාහිර දායකත්වය නමින් අතිරේක ප්‍රාග්ධනය සැපයීමක් ලෙස වර්ෂ 15 කටත් වැඩි කාලයක සිට අවණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නිබුණි.

(ණ) ඖෂධයේ වූර්ණයට මිශ්‍ර කර පුද්ගලික වෛද්‍යවරුන් හා ඖෂධ නිෂ්පාදනාගාර වෙත අලෙවි කරන කංසා කිලෝග්‍රෑම් 01ක විකුණුම් මිල ඉකුත් වර්ෂයේ රු.15,000ක්ද විය යුතු බවට මිල කමිටුවක් විසින් තීරණය කර නිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විකුණන ලද කංසා කිලෝග්‍රෑම් 543.79 ක් රු. 8,156.850 ක් ලෙස ගිණුම්ගත කර නිබුණි.

(න) වෙක්පතක් අහරු වීම හේතුවෙන් අදාල ණයහිමි ගිණුමට බැර කළ යුතු රු.2,658,145ක් කෙරිගෙන යන වැඩ ගිණුමට බැර කිරීම හේතුවෙන් කෙරිගෙන යන වැඩ ගිණුම හා ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ද) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව ණය ගැනි හා ණය හිමි ශේෂ පිළිවෙලින් රු. 83,167,687ක් හා 245,096,925ක් වූවද එදිනට පිළියෙල කර තිබුණු ණය ගැනි හා ණය හිමි කාල විශ්ලේෂණ අනුව ශේෂ පිළිවෙලින්රු. 79,338,845ක් හා රු. 245,063,455ක් වූයෙන් වෙනස පිළිවෙලින් රු. 3,828,842ක් හා රු. 33,470 ක් විය. තවද අලෙවි අංශය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැනි ශේෂය රු.81,446,189ක්වූ අතර ශේෂ පිරික්සුම අනුව එම දිනට වෙළඳ ණයගැනි ශේෂය රු.83,167,687ක් වූයෙන් රු.1,721,498ක වෙනසක්ද විය.ණය ගැනියන් හා ණය හිමියන් සඳහා පාලන ගිණුම් ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මෙම වෙනස්කම් වලට හේතුව වී තිබුණි. කෙසේ වුවද එම වෙනස්කම් වලට හේතු වූ කරුණු පැහැදිලි කිරීම කිසිවක් ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි.

(න) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.83,680,320ක් වූ ණය ගැනි ශේෂ 521 කින්, රු.20,589,095 ක්වූ ශේෂ 459 කට අදාළ ණය ගැනියන් වෙත ශේෂ සනාථන ලිපි යවා නොතිබුණි. ඒ අනුව රු.63,091,225 ක් වූ ශේෂ 62කට අදාළ ණයගැනියන් වෙත පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණු නමුත් ඉන් රු.53,697,309 ක්වූ ශේෂ 39ක් පිළිතුරු එවා නොතිබුණු අතර පිළිතුරු එවා තිබුණු රු. 9,393,916 ක් වූ ණය ගැනි ශේෂ 23 කින් රු. 1,094,058 ක් වූ ණය ගැනියන් 04 දෙනෙකු විසින් ගෙවීමට මුදලක් නොමැති බව සඳහන් කර තිබුණි. තවත් ණය ගැනියන් 02 දෙනෙකුට අදාලව පොත් අගය රු. 4,487,766 ක් වුවද, එම ණය ගැනියන් විසින් තහවුරු කළ ශේෂය රු. 5,438,742 ක් විය. ණය ගැනියන් 03 දෙනෙකු විසින් තමන්ට රු. 5,987 ක මුදලක් ආපසු ලැබීමට නොමැති බව දන්වා තිබුණි. ඒ අනුව රු. 79,862,241 ක්වූ ණය ගැනි ශේෂ 507 ක් ශේෂ සනාථ කිරීම මඟින් තහවුරු වී නොතිබුණි.

(ප) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 245,096,925 ක්වූ ණයහිමි ශේෂ 150 කින්, රු.124,052,230 ක්වූ ණයහිමි ශේෂ 27 කට අදාළ ණය හිමියන් වෙත ශේෂ සනාථන ලිපි යවා නොතිබුණි. ඒ අනුව රු. 121,044,695 ක්වූ ශේෂ 123 කට අදාළව පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණු නමුත් රු. 11,665 ක්වූ ණයහිමියන් 03 දෙනෙකු අයවීමට මුදලක් නොමැති බව ප්‍රකාශ කර තිබුණි. තවත් ණයහිමියන් 04 දෙනෙකුට අදාළ පොත් අගය රු. 3,409,384 ක් වුවද තහවුරු කළ ශේෂය රු. 7,960,432 ක් විය. රු.4,710,490 ක්වූ ණය හිමියන් 10 දෙනෙකු ශේෂ සමග එකඟ වී තිබුණි. ඒ අනුව රු. 181,170,588 ක්වූ ණයහිමි ශේෂ 73 ක් ශේෂ සනාථ කිරීම මඟින් තහවුරු වී නොතිබුණි.

(බ) හෙක්ටයාර 2.2 ක්වූ මැදවච්චිය ඔසු උයන, මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් විසින් සංස්ථාව වෙත පැවරීම සිදු කර තිබුණද එම ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉෙන නොතිබුණි.

(ම) 2011/2012 සිට 2013/2014 දක්වා තක්සේරු වර්ෂවලට අදාලව වෙන්කර තිබුණු රු.12,673,956 ක්වූ අදායම් බදු 2015, 2016 සහ 2017 යන වර්ෂවල දේශීය අදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවා තිබුණු අතර එම ගෙවීම් අදායම් බදු වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට "ලාභාංශ බදු" නමින් වූ ව්‍යාජ වත්කම් ගිණුමකට හර කර තිබුණි. මෙම වරද නිවැරදි කිරීම් සඳහා අදාල ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අදායම් බදු වෙන් කිරීමේ ගිණුමට එරෙහිව කපා හැරීමට කටයුතු කිරීම් වෙනුවට 2017 සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව එක් එක් වර්ෂවලට අදාල අදායම් බදු ගැලපීමේ සටහන් වල දැක්වෙන අදායම් බදු වෙන්කිරීමේ ගිණුමේ ශේෂයෙන් උක්ත ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අඩුකර දක්වා තිබුණි.

(ය) ණයවර ලිපි වලට අදාල සියයට 10 ක රැඳවුම් මුදල් රු. 1,894,902 කට අදාළ උපලේඛන, ටෙන්ඩර් ආරක්ෂිත තැන්පතු රු. 21,631,366 කට හා ගෙවිය යුතු තැන්පතු රු. 1,064,472

කට අදාළ උපලේඛන, නැන්පතු ලේඛණ හා කාල විශ්ලේෂණ, වර්ෂ 15 ක සිට නොවෙනස්ව පවතින රු. 1,923,741 ක්වූ ප්‍රාග්ධන සංචිත ශේෂය තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි හා රු. 636,000,000 ක ඉඩමවලට අදාළව අයිතිය තහවුරු කරන ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමහ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොඇලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදි එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දැක්වෙන (ආ), (උ),(ග), (ජ), (ට), (ඩ), (ණ),(ද),(න) සහ (ප) යන නිරීක්ෂණ හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධිවිධානයට යොමුව		විස්තරය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනත	
(i)	18(4) වගන්තිය	පනතේ 18(2) වගන්තිය අනුව තීරණය කරන ලද විගණන ගාස්තු අදාළ ආයතනය විසින් ඉන්වොයිසියේ සඳහන් දිනයේ සිට දින 30 ක් ඇතුළත නිරවුල් කළයුතු වුවත් එකී විධිවිධාන ප්‍රකාරව 2020 සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.4,568,400 ක්වූ විගණන ගාස්තු 2024 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.
(ii)	38(I)(ඉ) වගන්තිය	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාළ සීමාවන් තුළ සියලු විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතුය. එසේ වුවද 2019, 2020 හා 2022 යන ගිණුම් වර්ෂවලට අදාළ එකතුව රු.436,511,575 ක්වූ වටිනාකම් සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුම් 09 ක් සඳහා පිළිතුරු සැපයීමට 2024 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.
(iii)	39(1) හා 39(2) වගන්ති	1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන විස්තරාත්මක විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන්

		එම වාර්තාවේ දින සිට මාස 03ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු නිබෙ නම් ඒ බව විගණකාධිපතිවරයා වෙතද, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයා වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු වුවද, එකී විධිවිධාන ප්‍රකාරව 2020, 2021 සහ 2022 වර්ෂයන්හි විස්තරාත්මක විගණකාධිපති වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග 2024 අප්‍රේල් 30 දින දක්වා ගෙන නොනිබුණි.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
	(i) මුදල් රෙගුලාසි 103, 104 සහ 105	2019 වර්ෂයට අදාළව අලෙවි මධ්‍යස්ථාන හා ගබඩා 8 ක එකතුව රු. 2,178,305 ක් වූ ඌනතා සහ රු. 1,484,545 ක් වූ අතිරික්තතා සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 01 දිනැති අංක 14,026 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙන නිබුණු තීරණ අනුව කටයුතු කර නොනිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 156 (1) (අ) හා (ආ)	2019 දෙසැම්බර් 31 දිනට වාර්ෂික තොග සමීක්ෂණය අනුව හඳුනාගත් අංක 01/02 ගබඩාවේ 2012 ත් 2014 ත් කාලපරිවිඡේදයේ මිල දී ගෙන ඇති මුද්දරප්පලම් තොග ඌනතාවය රු.2,876,893ක් සහ අංක 10 ලේබල් ගබඩාවේ පසුගිය වර්ෂවල මුද්‍රණය කළ නමුත් ප්‍රයෝජනයට නොගත් ලේබල් තොග ඌනතාවය රු. 461,310 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 756 (6) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 ඡේදය	සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා අනුව අලෙවි සැල් 15ක හා නිමි තොග ගබඩා 02ට අදාලව රු.10,918,380ක් වටිනා නිමි තොග ඒකක 33,053ක ඌණතාවයක් හා අලෙවි සැල් 11ක හා නිමි තොග ගබඩාවකට අදාලව රු.4,295,630ක් වටිනා නිමි තොග ඒකක 8,841ක අතිරික්තයක් පැවැති නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.
	(iv) මුදල් රෙගුලාසි 1647(ආ)	වාහනද ඒවායේ උපකරණද ඇතුළුව සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, සංස්ථාව සතු වාහන සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.
(ඇ)	2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය	සේවාදායකයෙකු පාරිතෝෂික අරමුදල් ලබා ගැනීමට සුදුසුකම් ලද පසුව හැකි ඉක්මනින් ඔහුට අදාළ මුදල් ලබාදීම සඳහා 2023 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික අරමුදල වූ රු.44,495,114 කට සමාන මුදලක් ආයෝජනය කල යුතු වුවත් සංස්ථාව විසින් රු.30,189,375ක් පමණක් ස්ථාවර තැන්පතුවක

ආයෝජනය කර තිබුණි.

(ඇ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (අ), (ඇ) සහ (ඈ) ඡේද	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා දැනට සිටින කාර්ය මණ්ඩලය, අයවැය ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, කාල රාමුව හා අපේක්ෂිත නිමවුම් ඇතුළත් කර නොතිබුණි.
(ඉ)	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන දිරි දීමනා රු. 28,507,457 ක්, පැමිණීමේ දීමනා රු. 10,464,986 ක්, ඵලදායිතා දීමනා රු. 43,480,969 ක් ද, වශයෙන් එකතුව රු. 82,453,412 ක් ද, ඇතුළුව පසුගිය වර්ෂ 09කදී රු. 676,001,624 ක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.
(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ	අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් ද පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. **වෙනත් කරුණු**

(අ) නිෂ්පාදිත ඖෂධ වර්ගය මත බර තැබීමක් කරමින් අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා ක්‍රියාත්මක කිරීම නුළින් ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකි වන නමුත් එවැනි ක්‍රමයක් වෙනුවට රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02 ත් රු.මිලියන 06 ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ රු. 64,930,055 ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.82,453,412 ක් දක්වා සියයට 26 කින් වැඩිවී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යන අවස්ථාවලදී සංස්ථාවේ ලාභදායිත්වය අඩු වුවද ගෙවන නිෂ්පාදන දිරි දීමනාව වැඩි කිරීමට සිදුව තිබුණි.

(ආ) 2017, 2018, හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. 97,000,000 කින් රු. 26,149,834 ක් හෙවත් සියයට 27 ක් 2024 අප්‍රේල් 30 දින වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ඇ) රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.45,725,759 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින

ආරම්භ කර නිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.12,144,400 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර නිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර නිබුණි. 2024 අප්‍රේල් 30 වන විට වසර 05 ක් ඉක්මවා නිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොනිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතිය වෙනුවෙන් එතෙක් කළ වියදම අනාර්ථික බවට පත්ව නිබුණු අතර කොන්ත්‍රාත්තුවේ පිරිවැය රු. 58,940,280 ක් දක්වා රු. 25,431,163 කින් එනම් සියයට 75.89 කින් ඉහල ගොස් නිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, අරිෂ්ඨ , ආසව, තෙල්, ක්වාත, සිරප් ඇතුළු ඖෂධීය දියර වර්ග හා චූර්ණ, ගුලි, කල්ක, ලේප, ලේහ, මෝදක, රස, වටි ඇතුළු ඖෂධීය ද්‍රව්‍යයන්ට අදාළ නිෂ්පාදනයන් 13ක් සඳහා නිෂ්පාදන වැඩපත් 2,862ක් සැලසුම් කර නිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 2,384ක් වූයෙන් වැඩපත් 478ක ප්‍රමාණයක් එනම් සියයට 17 ක් නිමකර ගැනීමට නොහැකිවී නිබීම අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක කරා ළඟා නොවීමට ප්‍රධාන වශයෙන් හේතු වී නිබුණි.

(ඉ) සංස්ථාව විසින් අවස්ථා 160 කදී රු. 2,326,651 ක් වටිනා ඖෂධ නොමිලේ නිකුත් කර ඒවායේ පිරිවැය රු. 1,537,478 ක් පරිත්‍යාග ලෙස විකුණුම් හා බෙදා හැරීම් වියදම් යටතේ දක්වා නිබුණි. තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව පරිත්‍යාග ලබාදීම් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට 2019 ජූලි 08 දින හැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර වසර 05කට ආසන්න කාලයක් ගතවී නිබුණද මෙතෙක් එකී මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට සංස්ථාව අපොහොසත් වී නිබුණි.

(ඊ) සංස්ථාව විසින් පිළියෙල කර නිබුණු නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොනිබුණි.

(උ) 2018 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා ගණ 09ක් යටතේ සංස්ථාව සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර නිබුණු නමුත් ඒ අනුව සේවයේ ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමට හා සේවය ස්ථිර කල බවට පෞද්ගලික ලිපිගොනුවට පිටපතක් සහිතව ලිපියක් නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සිව්වන කාර්තුවෙහි රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ තථ්‍ය අලෙවි ආදායම රු. 1,215,283,637 ක් හා ආදායම් වියදම් ප්‍රකාශය අනුව තථ්‍ය අලෙවි ආදායම රු. 1,213,287,800 ක් වීමෙන් දක්වා ඇති අලෙවි ආදායම් අතර රු.1,995,837ක වෙනසක් විය. තවද එම කාර්ය සාධන වාර්තාවෙහි සිව්වන කාර්තුවට අනුව වෙනත් ආදායම් රු.6,368,965ක් ආදායම් වියදම් ප්‍රකාශය අනුව වෙනත් ආදායම් රු.40,077,706 ක් වීමෙන් වෙනත් ආදායම් අතර රු.33,708,741ක වෙනසක්ද විය.

(එ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ සමස්ථ විකුණුම් අදායම් ඇස්තමේන්තුව රු. 1,700,000,000 ක්වූ අතර තථ්‍ය ආදායම රු. 1,215,283,637 ක් විය. ඉන් රු. රු.770,881,496 ක් හෙවත් සියයට 63 ක්ම රාජ්‍ය අංශයෙන් ලැබී නිබුණු අතර පෞද්ගලික අංශයෙන් ලැබී නිබුණු ආදායම රු. 444,402,141 ක් හෙවත් සියයට 37 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු. 600,000,000 ක්වූ පෞද්ගලික අංශයේ ඇස්තමේන්තුවෙන් රු. 444,402,141 ක් හෙවත් සියයට 26 ක ආදායම් ඉලක්කයක් හා රාජ්‍ය අංශයේ රු.329,118,504ක එනම් සියයට 30ක ආදායම් ඉලක්කයක් ලභා කර ගැනීමට අපොහොසත් වී නිබුණි. වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීම, විකුණුම් අදායම අඩුවීමට හේතුවී නිබුණු බව නිරීක්ෂණය විය.

(ඒ) 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු 07 අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පටටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී

මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සංස්ථාවේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේදී මුදල් ප්‍රවාහයන් ප්‍රසස්ථව හා විචක්ෂණශීලීව කළමනාකරණය කර ගනිමින් නිසි ක්‍රමවේදයක් ඔස්සේ කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.84,542,736 ක්වූ ස්ථාවර තැන්පතු 03 ක් කල් පිරීමට පෙර ආපසු ගැනීම නිසා රු. 2,506,031 ක තැන්පතු පොළී අදායමක් අහිමිවී තිබුණු බව නිරීක්ෂණ විය.

(ඕ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ප්‍රමාණවත්ව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

මෙදිනට	සටහන	2023.12.31 රු.	ප්‍රති-ප්‍රකාශිත 2022.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	04	1,080,561,174	1,139,137,832
සිදු කෙරෙමින් පවත්නා කටයුතු	05	12,778,376	16,436,521
කාර්ය මණ්ඩල ණය	06.A	12,647,221	15,954,838
විලම්බිත බදුකරණය	17	-	1,804,601
		1,105,986,771	1,173,333,792
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛන	07	612,798,291	321,268,547
කාර්ය මණ්ඩල ණය	06.B	18,224,190	17,458,468
රන් තොග		1,841,645	5,561,695
ආන්නික ගිණුම්		105,908,646	31,245,792
විවිධ තැන්පතු	08	3,756,765	3,321,765
ස්ථාවර තැන්පතුවල කෙටි කාලීන ආයෝජන	09	112,189,375	112,131,811
වෙළඳ ණයකරුවෝ	10	81,173,248	145,603,836
වෙළඳ ණයකරුවන් වෙතින් ලද අතිරේක මුදල්		-	273
පෙර ගෙවුම් සහ අත්තිකාරම්	11	14,752,864	8,757,301
ඉතුරුම් ගිණුම - මහජන බැංකුව		14,452,333	7,030,637
මුදල් හා මුදල් සමාන දෑ	12	117,647,086	77,035,724
		1,082,744,442	729,415,850
සමස්ත වත්කම්		2,188,731,212	1,902,749,641
අරමුදල් හා බැරකම්			
දායක මුදල්			
දායක ප්‍රාග්ධනය		5,000,000	5,000,000
		5,000,000	5,000,000
බාහිර දායකත්වයන්	13		
මහා භාණ්ඩාගාරය		281,375,386	300,828,384
ලෝ.බැ.සං.		3,994,341	3,994,341
ආයුර්වේද අත්හදා බැලීම් ආයතනය		761,274	761,274
		286,131,001	305,583,999
සංචිත	14		
ප්‍රාග්ධන සංචිත		1,923,741	1,923,741
ප්‍රති-ඇගයුම්කරණ සංචිත		834,232,183	830,812,289
සෙසු සංචිත		(20,510,938)	-
රන් තොග ප්‍රති-ඇගයුම්කරණ සංචිත		-	3,720,050
විදේශ විනිමය හැඟීම් සංචිත		18,323	19,523
රඳවාගත් ඉපැයුම්		590,502,061	453,736,832
		1,406,165,370	1,290,212,435
සමස්ත අරමුදල්		1,697,296,370	1,600,796,434
බැරකම්			
ජංගම නොවන බැරකම්			
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම	15	23,967,056	16,773,300
බැංකු ණය - මහජන බැංකුව		12,000,000	16,333,334
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්	16	44,495,114	35,461,706
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල - දේශීය		3,903,612	5,701,000
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල - විදේශීය		130,768	-
විලම්බිත බදුකරණය	17	6,736,400	-
		91,232,950	74,269,340
ජංගම බැරකම්			
වෙළඳ ණය හිමියෝ		245,096,925	149,673,262
වෙළඳ ණය හිමියන්ගෙන් ලත් අතිරේක මුදල්		512,633	499,286
උපචිත වියදම්	18	38,193,071	32,035,761
සෙසු ජංගම බැරකම්	19	26,693,918	18,564,247
බදුකරණය සඳහා ප්‍රතිපාදනය	20	73,408,625	7,911,311
ජාතික පෞද්ගලික ශේවර්ධන අරමුදල		12,296,720	15,000,000
බැංකු ණය - මහජන බැංකුව		4,000,000	4,000,000
		400,201,892	227,683,867
සමස්ත අරමුදල් හා බැරකම්		2,188,731,212	1,902,749,641

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි. අංක 14606 දරන තීරණ අංකය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 පෙබරවාරි මස 21 වන දින ගිණුම් අනුමත කරන ලදි.

.....	.....	.....	.....	.....
සභාපති	කළමනාකරණ අධ්‍යක්ෂ	අ. මණ්ඩල සාමාජික	සාමාන්‍යාධිකාරී	නි.ඩ - ගිණුම් (වැ.මි.)

දිනය .....
වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර්ගත කොටසක් වේ.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2023 දෙසැම්බර් මස **31**වන දිනෙන් අවසන් වසර සඳහා	සටහන	**2023**	ප්‍රති-ප්‍රතාශිත 2022
		රු.	රු.
අලෙවිය	**23**	**1,215,283,637**	935,892,860
අඩුකළා: අලෙවි පිරිවැය	**24**	**756,212,888**	722,935,119
දළ ලාභය		**459,070,750**	212,957,741
සෙසු ආදායම්	**25**	**42,226,122**	33,357,523
		501,296,871	246,315,264
අඩුකළා: පරිපාලන සහ ආයතන වියදම්	**26**	**177,499,487**	184,922,843
අලෙවි සහ බෙදාහැරීමේ වියදම්	**27**	**121,898,062**	103,527,768
		299,397,549	288,450,611
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය		**201,899,323**	(42,135,347)
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	**28**	**16,186,960**	16,346,860
බද්දට පෙර ශුද්ධ අතිරික්තය		**218,086,282**	(25,788,488)
අඩුකළා: ආදායම් බදු වියදම්	**29**	**76,884,979**	589,810
බද්දට පසු ශුද්ධ අතිරික්තය		**141,201,303.42**	(26,378,298)
සෙසු විස්තීර්ණ ආදායම්			
ස්ථාවර වත්කම්වල ප්‍රති ඇගයුම්කරණ ලාභය / (අලාභය)		**-**	58,704,062
පාරිතෝෂික ප්‍රතිපාදන ආයුගණක ලාභය / (අලාභය)		**(20,510,938)**	-
වසර සඳහා වූ සමස්ත සෙසු විස්තීර්ණ ආදායම		**(20,510,938)**	58,704,062
වසර සඳහා වූ සමස්ත විස්තීර්ණ ආදායම		**120,690,365**	32,325,764

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වනු ලබයි.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය

2023 දෙසැම්බර් මස **31**වන දිනෙන් අවසන් වසර සඳහා			ප්‍රති-ප්‍රකාශිත
	සටහන	**2023**	2022
		රු.	රු.
අමුද්‍රව්‍ය පරිභෝජනය			
ආරම්භක තොගය		**96,004,550**	85,399,305
එකතුකළා: මිලදී ගැනීම්		**653,026,763**	412,494,594
		749,031,312	497,893,900
අඩුකළා: වසා දැමීමේ තොගය		**97,935,062**	96,004,550
අමුද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**651,096,251**	401,889,350
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය			
ආරම්භක තොගය		**39,356,268**	16,364,357
එකතු කළා: මිලදී ගැනීම්		**60,613,803**	72,563,300
		99,970,072	88,927,657
අඩුකළා: අවසන් තොගය		**28,099,379**	39,356,268
අමුද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**71,870,693**	49,571,389
දැවිතෙල් පරිභෝජන පිරිවැය			
ආරම්භක තොගය		**2,568,000**	1,059,750
එකතු කළා: මිලදී ගැනීම්		**68,174,213**	66,049,522
		70,742,213	67,109,272
අඩුකළා: අවසන් තොගය		**1,624,950**	2,568,000
දැවිතෙල් පරිභෝජන පිරිවැය		**69,117,263**	64,541,272
සෘජු කම්කරු වියදම්	**21**	**138,168,177**	119,866,376
සමස්ත සෘජු නිෂ්පාදන පිරිවැය		**930,252,383**	635,868,386
කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය			
වක්‍ර වියදම්	**22**	**129,651,595**	108,655,904
එකතු කළා: ආරම්භක අවසන් නොකළ		**20,691,648**	21,926,628
අඩු කළා: අවසන් අවසන් නොකළ		**21,234,120**	20,691,648
		129,109,123	109,890,884
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය දක්වා ඉදිරියට ගෙන ගිය වසරේ සමස්ත නිෂ්පාදන පිරිවැය		**1,059,361,507**	745,759,270

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ. වරහන් තුළ දී ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වනු ලබයි.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා

		ප්‍රති-ප්‍රකාශිත
	2023	2022
	රු.	රු.
මෙහෙයුම් කටයුතුවලින් උත්පාදිත මූල්‍ය ප්‍රවාහය		
බදුකරණයට පෙර සමස්ත අතිරික්තය	**218,086,282**	(25,788,488)
ගැලපීම්		
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	**7,193,755**	8,298,643
දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වීම	**63,131,002**	57,091,291
ක්‍රමක්ෂය භාණ්ඩාගාර අරමුදල් (ක්ෂයවීම්)	**(19,452,999)**	(19,487,730)
සේවක ප්‍රතිලාභ ගැලපීම්	**7,140,077**	4,522,773
පෙර වසර ගැලපීම්	**(4,436,074)**	(8,918,378)
ක්‍රමක්ෂය - අනුරාධපුර ගොඩනැගිලි ගිවිසුම	**-**	-
ස්ථාවර තැන්පතුවල ආයෝජනය - මුදල් නොවන ප්‍රමාණය	**2,506,031**	(9,555,896)
	274,168,075	6,162,215
කාරක ප්‍රාග්ධනය මාරු කිරීමට පෙර ලාභය		
භාණ්ඩ ලේඛන වැඩිවීම / (අඩුවීම)	**(291,529,744)**	(60,978,530)
කාර්ය මණ්ඩල ණය වැඩිවීම / (අඩුවීම)	**2,541,895**	(5,472,244)
පෙර ගෙවුම් හා අත්තිකාරම් වැඩිවීම / (අඩුවීම)	**(5,995,563)**	11,141,590
විවිධ තැන්පතු වැඩිවීම / (අඩුවීම)	**(435,000)**	(74,025)
වෙළඳ ණය හිමියන් වැඩිවීම / (අඩුවීම)	**64,430,589**	(35,938,145)
ආන්තික ගිණුම වැඩිවීම / (අඩුවීම)	**(74,662,854)**	(11,935,681)
වෙළඳ ණය හිමියන් වෙතින් ලද අතිරික්ත මුදල් වැඩිවීම / (අඩුවීම)	**273**	-
වෙළඳ ණය හිමියන් වැඩිවීම / (අඩුවීම)	**95,423,662**	71,801,234
සෙසු ජංගම වගකීම් වැඩිවීම / (අඩුවීම)	**8,129,671**	4,328,424
උපචිත වියදම් වැඩිවීම / (අඩුවීම)	**6,157,310**	(3,872,613)
වෙළඳ ණයකරුවන් වෙතින් ලද අතිරික්ත මුදල් වැඩිවීම / (අඩුවීම)	**13,347**	4,419
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල - දේශීය වැඩිවීම / (අඩුවීම)	**(1,797,388)**	5,701,000
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල - විදේශීය වැඩිවීම / (අඩුවීම)	**130,768**	-
විදේශ විනිමය ගැලපුම් සංචිත වැඩිවීම / (අඩුවීම)	**(1,200)**	-
ප්‍රති-ඇගයුම්කරණ සංචිත වැඩිවීම / (අඩුවීම)	**3,419,894**	-
ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල වැඩිවීම / (අඩුවීම)	**(2,703,280)**	-
	77,290,456	(19,132,355)
අඩුකළා: ගෙවන ලද පාරිතෝෂික	**(18,617,608)**	(2,347,402)
ගෙවූ බදු මුදල්	**(2,846,664)**	-
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**55,826,184**	(21,479,758)
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්		
පුද්ගලික ආරක්ෂක උපකරණ අත්පත් කරගැනීම	**(4,554,344)**	(63,204,487)
ඉටු කෙරෙමින් පවත්නා කටයුතු ආශ්‍රිත ආයෝජනය	**3,658,145**	(4,292,111)
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	**(2,563,595)**	75,284,257
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(3,459,793)**	7,787,659
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
මහා භාණ්ඩාගාරයෙන් ලත් මුදල්	**-**	-
ලබාගත් / (ආපසු ගෙවන ලද) බැංකු ණය	**(4,333,333)**	(4,000,000)
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(4,333,333)**	(4,000,000)
මුදල් හා මුදල් සමාන දෑ ආශ්‍රිත ශුද්ධ ඉහළ යාම / (පහළ යාම)	**48,033,058**	(17,692,099)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	**84,066,361**	101,758,461
වසර අවසන මුදල් හා මුදල් සමාන දෑ	**132,099,419**	84,066,361

දෙසැම්බර් 31 දිනට	**2023**	2022
	රු.	රු.
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ. 97100-182315453	**29,548,576**	4,739,076
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ. No. 97100-272315453	**12,267,723**	10,674,353
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ. 97100-362315453	**45,107,253**	40,774,959
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ. 97200-432315453	**23,770,220**	12,925,761
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ.	**14,452,333**	7,030,637
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ. 097-4023-62315453	**129,568**	-
ලංකා බැංකුව ආයතනික ශාඛාව ගි.අ. 00001209	**5,928,747**	5,721,575
මහජන බැංකුව, ගංගොඩවිල ගි.අ. 87653784	**895,000**	2,200,000
	132,099,419	84,066,361

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ දී ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වනු ලබයි.

ස්කන්ධ ප්‍රග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා

	ප්‍රති-ප්‍රකාශිත						
	2023.01.01 දිනට ශේෂය	පෙර වසර ගැලපීම්	විනිමය අලාභය	භාණ්ඩාගාර අරමුදල් ක්‍රමක්ෂය (13.1 සටහන)	ආයුගණක ලාභය/ (අලාභය)	වසර සඳහා වූ ශුද්ධ අතිරික්තය	**2023.12.31 දිනට ශේෂය**
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**5,000,000**	-	-	-	-	-	**5,000,000**
මහා භාණ්ඩාගාරය	**300,828,384**	-	-	(19,452,999)	-	-	**281,375,386**
ලෝ.සෞ.සං.	**3,994,341**	-	-	-	-	-	**3,994,341**
ආයුර්වේද අත්හදා බැලීමේ ආයතනය	**761,274**	-	-	-	-	-	**761,274**
ප්‍රාග්ධන සංචිත	**1,923,741**	-	-	-	-	-	**1,923,741**
ප්‍රතිඇගයුම්කරණ සංචිත - රන් තොග	**3,720,050**	(3,720,050)	-	-	-	-	-
ප්‍රතිඇගයුම්කරණ සංචිත -ඉඩම්	**517,677,685**	-	-	-	-	-	**517,677,685**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -ගොඩනැගිලි	**161,457,187**	-	-	-	-	-	**161,457,187**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -යන්ත්‍රෝපකරණ	**53,431,185**	-	-	-	-	-	**53,431,185**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -ජල සම්පාදන උපකරණ	**14,678,456**	-	-	-	-	-	**14,678,456**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -රසායනාගාර උපකරණ	**476,874**	-	-	-	-	-	**476,874**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -මෝටර් වාහන	**82,772,470**	-	-	-	-	-	**82,772,470**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -භාණ්ඩ තොග	**1,927,561**	-	-	-	-	-	**1,927,561**
ප්‍රතිඇගයුම්කරණ සංචිත -කාර්යාලයීය උපකරණ	**(3,419,894)**	3,419,894	-	-	-	-	-
ප්‍රතිඇගයුම්කරණ සංචිත -2017 වසරට පෙර	**1,810,765**	-	-	-	-	-	**1,810,765**
විදේශ විනිමය ඉහළ නැංවීමේ සංචිත	**19,523**	-	(1,200)	-	-	-	**18,323**
වෙනත් සංචිත	**-**	-	-	-	(20,510,938)	-	**(20,510,938)**
රඳවාගත් ඉපැයුම්	**453,736,832**	(4,436,074)	-	-	-	141,201,303	**590,502,061**
එකතුව	**1,600,796,434**	**(4,736,230)**	**(1,200)**	**(19,452,999)**	**(20,510,938)**	**141,201,303.42**	**1,697,296,370**

****2022 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශනය**

2022 වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාල පරිච්ඡේදය තුළ හඳුනාගන්නා ලද ද්‍රව්‍යාත්මක දෝෂ හේතුකොට ප්‍රති-ප්‍රකාශනයකට යටත් කෙරිණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම් සහ දෝෂ යන කොටස තුළ අවශ්‍ය බවට පනවා ඇති පරිදි, ලබාදෙනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වයද සහතික කරනු පිණිස වහා ප්‍රතිකර්මක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදි. මෙම ගැටලු නිවැරදි කරනු පිණිස මූල්‍ය ප්‍රකාශන දැඩිසේ සමාලෝචනය කරන ලද අතර, අතීතයට බලපාන පරිදි සන්සන්දනාත්මක සංඛ්‍යා නැවත ප්‍රකාශ කරන ලදුව එම ප්‍රති ප්‍රකාශනයන්හි බලපෑම් පහත සාරාංශගත කොට ඇත.

	රු.
ප්‍රති ප්‍රකාශනයට පෙර මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර රඳවාගත් ඉපැයුම්	**485,984,039**
තොග ගණන් ගැනීම් හේතුකොට ප්‍රතිප්‍රකාශන ගැලපුම්	(26,797,208)
ප්‍රතිඇගයුම්කරණ සංචිත හේතුකොට ප්‍රතිප්‍රකාශන ගැලපුම්	(5,450,000)
ප්‍රති ප්‍රකාශනයෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර රඳවාගත් ඉපැයුම්	**453,736,832**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

ගිණුම්කරණ ප්‍රතිපත්ති - 2023

1. සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව (SLADC) 1969 මැයි 11 දිනැති අංක 14853/1 දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1969 දී ස්ථාපිත කරන ලදී. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ආයුර්වේද ඖෂධ සහ ඖෂධ නිෂ්පාදනය කිරීම සහ ඒවා රජයේ රෝහල්, ආයුර්වේද වෛද්‍යවරුන් සහ පෞද්ගලික අංශය වෙත අලෙවි කිරීමයි.

2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කාර්ය මණ්ඩලය 378ක් විය (2022 - 355)

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සම කොටස් විචලන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන")ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් නියම කර ඇති නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) සහ ශ්‍රී ලංකා රජය විසින් සකස් කරන ලද මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2024 පෙබරවාරි 28 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර ලබා දී ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංකය: 14606)

2.2 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.
මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

2.3 අඛණ්ඩ පැවැත්මක් සහිත ආයතනයක් බව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනාගතයේදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳ ඇගයීමක් සිදු කර ඇති අතර ඔවුන් විසින් සංස්ථාවේ ක්‍රියාකාරකම් අත්හිටුවීමක් හෝ නැවැත්වීමක් අවශ්‍ය වන බවක් පුරෝකථනය කරනු ලැබ නොමැත.

2.4 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වර්ෂය සමඟ සංසන්දනය කළ හැකි වන පරිදි අවශ්‍ය තැන්වලදී සංශෝධනය කර ඇත.

2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීම සහ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම්වල වාර්තා කළ ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම්, ප්‍රවණතා සහ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන වෙනත් සාධක මත පදනම් වේ. ඒ අනුව, සත්‍ය ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ මූලික උපකල්පන ඒවායේ වලංගුභාවය තහවුරු කිරීම සඳහා අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයේ සහ බලපෑමට ලක්වන ඕනෑම අනාගත කාලපරිච්ඡේදයක හඳුනාගනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් කෙරෙහි වැඩිම බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමේදී කරන ලද තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන්වල ඇතුළත් වේ:

සටහන 16 - නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මැනීම.
සටහන 17 - විලම්බිත බදුකරණය

2.6 විදේශ මුදල් ගනුදෙනු

(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතමයන් ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (ක්‍රියාකාරී මුදල් ඒකකය) භාවිතයෙන් මනිනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන සංස්ථාවේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (LKR ඉදිරිපත් කර ඇත.

(ආ) ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනු සිදු කරන දිනවල පැවති විනිමය අනුපාත භාවිතා කරමින් විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ.

03. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. අන්‍යාකාරයෙන් සඳහන් කර නොමැති නම්, මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කර ඇති සියලුම වර්ෂ සඳහා අඛණ්ඩව යොදා ගෙන ඇත.

3.1 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීමේ පදනම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වන්නේ මුදල්, බැංකු ශේෂයන් සහ සංස්ථාවේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී, හෝ වාර්තාකරණ දිනයේ සිට එක් වසරක් ඇතුළත, යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කිරීමට අපේක්ෂා කරන ඒවාය. ජංගම නොවන වත්කම් යනු වාර්තාකරන දිනයේ සිට එක් වසරක කාලයකට වඩා වැඩි කාලයක් තබා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

3.1.1 දේපල, පිරියත සහ උපකරණ

3.1.1.1 හඳුනාගැනීම සහ මිනුම්කරණය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැය එහි මිලදී ගැනීමේ මිල සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ වන ඕනෑම පිරිවැයකින් සමන්විත වේ.

ස්වයං-නිර්මිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ වන වෙනත් ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ. මෙයට අයිතම ගලවා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටි ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලත් වත්කම් මත ණය ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටස්වලට වෙනස් ප්‍රයෝජනවත් ආයු කාලයන් ඇති විට, ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙන් වූ අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

දේපල පිරියත හා උපකරණවල ධාරණ අගයන් ඒවායේ ධාරණ අගය අය කර ගත නොහැකි විය හැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් සිදුවන සෑම අවස්ථාවකදීම හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි අගයට වඩා වැඩි නම්, වත්කමේ ධාරණ අගය වහාම එහි අය කර ගත හැකි අගයට අගය කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක් බැහැර කිරීමෙන් ලැබෙන ලාභ හා අලාභ තීරණය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන මුදල සහ දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය අතර වෙනස ලෙස වන අතර, ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනාගනු ලැබේ.

3.1.1.2 පසු පිරිවැය

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එම අයිතමයේ ධාරණ අගයෙහි හඳුනාගනු ලබන්නේ එම කොටස තුළ ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් ය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ ධාරණ අගය ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරේ.

දේපල, පිරියත හා උපකරණවල දෛනික සේවා කිරීමේ පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ.

3.1.1.3 මූල්‍ය වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

දේපල, පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය බැහැර කිරීමේදී හෝ එහි භාවිතය හෝ බැහැර කිරීම තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට එය හඳුනා නොගැනීමක් හෙවත් ඉවත් කිරීමක් වේ. හඳුනා නොගැනීම මත ඇති වන ලාභ හෝ අලාභ ලාභ සහ අලාභ තුළ වෙනත් ආදායම් යටතේ හඳුනාගනු ලැබේ.

3.1.1.4 අනුරාධපුර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා පිරිවැය

අනුරාධපුර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා පිරිවැය වසර 5ක කාලයක වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. (දේපල වසර 5ක කාලයක් සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත පවරා ඇත)

3.1.1.5 නරක්වූ හා අඩමාන ණය

නරක්වූ ණය

අදාළ මුදල අයකරගත නොහැකි බවට තහවුරු වූ විටදී නරක්වූ ණය ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

අඩමාන ණය

හිඟ ශේෂයන් පසුගිය වසර පහකට වඩා වැඩි කාලයක් පැවතුනහොත් අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

3.1.1.6 ණය ගැනීමේ පිරිවැය

එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගත වන සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය සඳහා සෘජුවම අදාළ වන ණය ගැනීමේ පිරිවැය වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැය ප්‍රමාණයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 - ණය ගැනීමේ පිරිවැය අනුව තීරණය කරනු ලැබේ.

ප්‍රාග්ධනීකරණය නොකරන ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදයේ වියදම් ලෙස හඳුනාගනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ.

3.1.1.7 ක්ෂයවීම්

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ ක්ෂය කළ හැකි ප්‍රමාණය මත වන අතර, එය වත්කමක පිරිවැය හෝ පිරිවැය වෙනුවට ආදේශ කරන ලද වෙනත් ප්‍රමාණයකින් එහි අවශේෂ අගය අඩු කිරීමෙන් ලැබේ.

ක්ෂය වීම හඳුනාගනු ලබන්නේ දේපල, පිරියත හා උපකරණ අයිතමයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල රේඛා පදනම මත ලාභ හෝ අලාභ තුළ ය. මන්ද යත් මෙමගින් වත්කමේ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව වඩාත්ම නිවැරදිව පිළිබිඹු කරන බැවිනි.

බදු වත්කම් ක්ෂය කරනු ලබන්නේ බදු කාලසීමාව සහ ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ය. නමුත් බදු කාලසීමාව අවසානයේ සංස්ථාව විසින් අයිතිය ලබා ගන්නා බවට සාධාරණ සහතිකයක් ඇති විට තත්ත්වය එසේ නොවේ. ඉඩම් ක්ෂය නොකරයි. මෙම සංස්ථාවට අදාළ කිසිදු බදු වත්කමක් නොමැත.

වත්මන් සහ සංසන්දනාත්මක කාලපරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාල සහ ක්ෂය වීමේ අනුපාත පහත පරිදි වේ:

වත්කම් කාණ්ඩය	ප්‍රයෝජනවත් ආයු කාලය (වර්ෂ)	ක්ෂයවීම් අනුපාතය (%)
ගොඩනැගිලි	වසර 20	5%
යන්ත්‍රසූත්‍ර	වසර 06.66	15%
ජල සම්පාදන උපකරණ	වසර 06.66	15%
රසායනාගාර උපකරණ	වසර 06.66	15%
කාර්යාලයීය උපකරණ	වසර 10	10%
මෝටර් වාහන	වසර 05	20%
මෙවලම් හා උපකරණ	වසර 03	33.33%

වත්කමක ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතය සඳහා සූදානම්ව පවත්නා විට වන අතර වත්කමක ක්ෂය වීම නතර වන්නේ වත්කම විකිණීම සඳහා තබාගත් ලෙස වර්ගීකරණය කරන දිනය සහ වත්කම හඳුනා නොගන්නා හෙවත් තවදුරටත් නොපිළිගන්නා දිනය යන දෙකෙන් පළමුව පැමිණෙන දිනයේදීය.

ක්ෂය වීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාල සහ අවශේෂ අගයන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කරනු ලබන අතර සුදුසු නම් ගැලපුම් කරනු ලැබේ.

3.1.1.8 සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු

වාර්තාකරන දිනය වනවිට සම්පූර්ණ කොට නොමැති ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු ලෙස පෙන්නුම් කෙරෙන අතර වසර තුළ සම්පූර්ණ කරන ලදුව ප්‍රයෝජනය සඳහා තබා ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කොට ඇත.

3.1.1.9 මූල්‍ය කොන්ත්‍රාත් ලේඛන - මූලික හඳුනාගැනීම සහ පසු මිනුම්කරණය

මූල්‍ය කොන්ත්‍රාත් ලේඛනයක් යනු එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ තවත් ආයතනයක මූල්‍ය වගකීමක් හෝ හිමිකම් කොන්ත්‍රාත් ලේඛනයක් ඇති කරන ඕනෑම ගිවිසුමකි.

මූල්‍ය වත්කම්

මූලික හඳුනා ගැනීම සහ මිනුම්කරණය

මූලික හඳුනාගැනීමේදී, මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබන්නේ පසුව ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීර්ණ ආදායම (OCI) හරහා සාධාරණ අගය, සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය යටතේ මනිනු ලබන ආකාරයෙනි.

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම්වල වර්ගීකරණය රඳා පවතින්නේ මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ව්‍යාපාර ආකෘතිය මතය. සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක් නොමැති හෝ සමාගම ප්‍රායෝගික පහසුව යොදාගෙන ඇති වෙළඳ ලැබිය යුතු දෑ හැර, සමාගම මුලින්ම මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එහි සාධාරණ අගයට, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් නොවන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් නම් ගනුදෙනු පිරිවැය ද එකතු කරමිනි.

මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැය හෝ OCI හෙවත් සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය යටතේ වර්ගීකරණය කර මැනීම සඳහා, හිඟ මූලික මුදල මත 'මූලික මුදල සහ පොලී ගෙවීම් පමණක් (SPPI)' වන මුදල් ප්‍රවාහ ඇති කළ යුතුය. මෙම තක්සේරුව SPPI පරීක්ෂණය ලෙස හැඳින්වෙන අතර එය මූල්‍ය කොන්ත්‍රාත් ගිවිසුම් මට්ටමින් සිදු කරනු ලැබේ. මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ව්‍යාපාර ආකෘතිය යනු මුදල් ප්‍රවාහ උත්පාදනය කිරීම සඳහා එහි මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරයයි. මුදල් ප්‍රවාහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමෙන්, මූල්‍ය වත්කම් විකිණීමෙන්, හෝ දෙකෙන්ම උද්ගත වන්නේද යන්න ව්‍යාපාර ආකෘතිය මගින් තීරණය කරනු ලබයි.

වෙළඳපොළේ රෙගුලාසි හෝ සම්මුතිය මගින් ස්ථාපිත කාල රාමුවක් තුළ වත්කම් බෙදාහැරීම අවශ්‍ය කරන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම් (සාමාන්‍ය ක්‍රම වෙළඳාම්) හඳුනාගනු ලබන්නේ වෙළඳ දිනයේදී, එනම් සමාගම වත්කම මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටින දිනයේදීය.

පසු මිනුම්කරණය
පසු මිනුම්කරණය සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කෙරේ:

1. ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් (ණය කොන්ත්‍රාත් ගිවිසුම්)
2. සමුච්චිත ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය සහිත සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය යටතේ මූල්‍ය වත්කම් (ණය කොන්ත්‍රාත් ගිවිසුම්)
3. හඳුනා නොගැනීමේදී සමුච්චිත ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය නොමැතිව සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය යටතේ නම් කළ මූල්‍ය වත්කම් (හිමිකම් කොන්ත්‍රාත් ගිවිසුම්)
4. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය යටතේ මූල්‍ය වත්කම්

එහෙත්, සමාගමේ මූල්‍ය වත්කම් වර්ගීකරණය ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් (ණය කොන්ත්‍රාත් ගිවිසුම්) සහ සෙසු විස්තීර්ණ වියදම්වලට සාධාරණ වටිනාකම හෙවත් FVOCI යටතේ නම් කළ මූල්‍ය වත්කම් (සම කොටස් කොන්ත්‍රාත් ගිවිසුම්) වලට පමණක් සීමා වේ.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් (ණය කොන්ත්‍රාත් ගිවිසුම්)
මෙම කාණ්ඩය සමාගමට වඩාත් අදාළ වේ. පහත කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සමාගම විසින් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබයි:

*මූල්‍ය වත්කම දරා සිටින්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් දරා සිටීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ වීම සහ

*මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනවලදී හිඟ මූලික මුදල මත මූලික මුදල සහ පොලී ගෙවීම් පමණක් වන මුදල් ප්‍රවාහ ඇති කිරීම.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් පසුව මනිනු ලබන්නේ සඵල පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් වන අතර හානිකරණයට යටත් වේ. වත්කම හඳුනා නොගන්නා විට, වෙනස් කරන විට හෝ හානි වන විට ලාභ හා අලාභ ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ.

සමාගමේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්වලට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ, මුදල් හා බැංකු සහ සම්බන්ධිත පාර්ශ්වවලට ලබා දුන් ණය ඇතුළත් වේ.

සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය යටතේ නම් කළ මූල්‍ය වත්කම් (සම කොටස් කොන්ත්‍රාත් ගිවිසුම්)

මූලික හඳුනාගැනීමේදී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 32 මූල්‍ය උපකරණ: ඉදිරිපත් කිරීම යටතේ හිමිකම් නිර්වචනයට අනුකූල වන විට සහ වෙළඳාම සඳහා නොතබා සිටින විට, සමාගමට එහි හිමිකම් ආයෝජන සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය යටතේ හිමිකම් උපකරණ ලෙස අප්‍රතිවර්ත්‍ය ලෙස වර්ගීකරණය කිරීමට තෝරාගත හැකිය. වර්ගීකරණය තීරණය කරනු ලබන්නේ කොන්ත්‍රාත් ගිවිසුමෙන් ගිවිසුම හෙවත් එකින් එක පදනමිනි.

මෙම මූල්‍ය වත්කම් මත ලාභ හා අලාභ කිසි විටෙකත් ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය නොකරයි. ගෙවීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ මූල්‍ය ආදායම ලෙස හඳුනාගනු ලැබේ.

නමුත් සමාගම එවැනි ආදායම් මූල්‍ය වත්කමේ පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් ලෙස ප්‍රතිලාභ ලබන විට, එවැනි ලාභ සෙසු විස්තීර්ණ ආදායම් හි වාර්තා කරයි. සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය යටතේ නම් කළ හිමිකම් උපකරණ හානිකරණ තක්සේරුවට යටත් නොවේ.

සමාගම මෙම කාණ්ඩය යටතේ එහි ලැයිස්තුගත හිමිකම් ආයෝජන අප්‍රතිවර්ත්‍ය ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගත්තේය.

මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් හඳුනා නොගත් වත්කම් ඉවත් කිරීම
මූල්‍ය වත්කමක් (හෝ, අදාළ වන විට, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) ප්‍රාථමික වශයෙන් හඳුනා නොගන්නේ (එනම්, සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කරනු ලබන්නේ) පහත අවස්ථාවලදී ය:

*වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට, හෝ
*සමාගම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය මාරු කර ඇති විට හෝ 'සංචලන' විධිවිධානයක් යටතේ ප්‍රමාද කිරීමකින් තොරව තෙවන පාර්ශ්වයකට ලැබුණු මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම ගෙවීමේ බැඳීමක් භාරගෙන ඇති විට සහ
(අ) සමාගම වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට, හෝ
(ආ) සමාගම වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන නොමැති නමුත් වත්කමේ පාලනය මාරු කර ඇති විට

මූල්‍ය වත්කම් හානිකරණය
සමාගම ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් නොමනින සියලුම ණය කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා දීමනාවක් හඳුනාගනී. අපේක්ෂිත ණය අලාභ පදනම් වන්නේ ගිවිසුමට අනුව ලැබිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ සමාගම ලැබීමට අපේක්ෂා කරන සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත වන අතර, මුල් සඵල පොලී අනුපාතයේ ආසන්න අගයකින් වට්ටම් කරනු ලැබේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහවලට ගිවිසුම්ගත නියමයන්ට අත්‍යවශ්‍ය වන පවත්නා ඇපකර හෝ වෙනත් ණය වර්ධන විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ ඇතුළත් වනු ඇත.

අපේක්ෂිත ණය අලාභ හඳුනාගනු ලබන්නේ අදියර දෙකකිනි. මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදු වී නොමැති ණය නිරාවරණ සඳහා, ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි පැහැර හැරීම් සිදුවීම් වලින් ඇතිවන ණය අලාභ සඳහා අපේක්ෂිත ණය අලාභ සපයනු ලැබේ (මාස 12 ක අපේක්ෂිත ණය අලාභ). මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදු වී ඇති ණය නිරාවරණ සඳහා, පැහැර හැරීමේ කාලය නොතකා නිරාවරණයේ ඉතිරි ආයු කාලය පුරා අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් අවශ්‍ය වේ (ජීවිත කාලීන අපේක්ෂිත ණය අලාභ).

වෙළඳ ලැබිය යුතු දෑ සහ ගිවිසුම් වත්කම් සඳහා, සමාගම අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී සරල ප්‍රවේශයක් අනුගමනය කරයි. එබැවින්, සමාගම ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරන අතර, ඒ වෙනුවට සෑම වාර්තාකරණ දිනයකදීම ජීවිත කාලීන අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව අලාභ දීමනාවක් හඳුනාගනී. සමාගම එහි ඓතිහාසික ණය අලාභ අත්දැකීම් මත පදනම් වූ ප්‍රතිපාදන පසුබිමක් ස්ථාපිත කර ඇති අතර, එය ණයගැතියන්ට සහ ආර්ථික පරිසරයට විශේෂිත ඉදිරි දැක්මේ සාධක සඳහා ගලපා ඇත.

සමාගම ගිවිසුම්ගත ගෙවීම් දින 365 ක් පසුවී ඇති විට මූල්‍ය වත්කමක් පැහැර හැරීමක් ලෙස සලකයි. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී, සමූහය විසින් දරා සිටින ඕනෑම ණය වර්ධනයක් සැලකිල්ලට ගැනීමට පෙර හිඟ ගිවිසුම්ගත මුදල් සම්පූර්ණයෙන්ම ලැබීමට සමූහයට ඉඩ නැති බව අභ්‍යන්තර හෝ බාහිර තොරතුරු පෙන්නුම් කරන විට සමාගම මූල්‍ය වත්කමක් පැහැර හැරීමක් ලෙස සැලකිය හැකිය. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති විට මූල්‍ය වත්කමක් කපා හරිනු ලැබේ.

මූල්‍ය වගකීම්

ආරම්භක හඳුනාගැනීම සහ මැනීම

මූල්‍ය වගකීම්, ආරම්භක හඳුනාගැනීමේදී, ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වගකීම්, ණය සහ ණය ගැනීම්, ගෙවිය යුතු දෑ, හෝ සඵල රක්ෂණයක රක්ෂණ කොන්ත්‍රාත් ගිවිසුම් ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයෙන් හඳුනාගනු ලබන අතර, ණය හා ණය ගැනීම් සහ ගෙවිය යුතු දෑ සඳහා, සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැය ශුද්ධව හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍ය වගකීම්වලට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා, ණය හා ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය වගකීම් ඇතුළත් වේ.

පසුව මැනීම

පහත විස්තර කර ඇති පරිදි මූල්‍ය වගකීම් මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

ණය සහ ණය ගැනීම්

මෙය සමාගමට වඩාත් අදාළ වන ප්‍රවර්ගයයි. මුල් හඳුනාගැනීමෙන් පසු, පොලී දරන ණය සහ ණය ගැනීම් පසුව සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. වගකීම් අහෝසි කිරීමේදී මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහාද ලාභ සහ අලාභ ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමේදී ඇති වට්ටම් හෝ වාරිකය සහ සඵල පොලී අනුපාතයෙහි අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ලාභ අලාභ ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස ඇතුළත් කර ඇත.

අහෝසි කිරීම හෙවත් මූල්‍ය ප්‍රකාශනයෙන් ඉවත් කිරීම

වගකීම යටතේ ඇති බැඳීම නිදහස් කිරීමේදී, අවලංගු කිරීමේදී හෝ කල් ඉකුත් වීමේදී මූල්‍ය වගකීම අහෝසි කරනු ලැබේ. පවතින මූල්‍ය වගකීමක් එකම ණය හිමියාගෙන් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත වෙනත් වගකීමක් මගින් ප්‍රතිස්ථාපනය කරන විට, හෝ පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් සලකනු ලබන්නේ මුල් වගකීම අහෝසි කිරීමක් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙසය. අදාළ ඉදිරියට ගෙන යන ප්‍රමාණයන්හි වෙනස ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

මූල්‍ය කොන්ත්‍රාත් ගිවිසුම් හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන්නේ, හඳුනාගත් මුදල් හිලව් කිරීමට දැනට ක්‍රියාත්මක කළ හැකි නීතිමය අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපයාගෙන වගකීම් එකවර පියවීමට අදහසක් ඇත්නම් පමණි.

මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය කොන්ත්‍රාත් ගිවිසුමක ප්‍රති පාර්ශ්වයක් සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අසමත් වීමෙන් සංස්ථාවට සිදුවන මූල්‍ය අලාභයේ අවදානමයි, එය ප්‍රධාන වශයෙන් සංස්ථාව වෙත ගනුදෙනුකරුවන්ගෙන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දෑ වලින් පැන නගී.

සංස්ථාව විසින් වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සහ ආයෝජන සම්බන්ධයෙන් දරන ලද අලාභවල ඇස්තමේන්තුව නිරූපණය කරන හානිකරණ දීමනාවක් පිහිටුවනු ලබයි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවනු ලබන එහි මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් ඉටු කිරීමේදී සංස්ථාව අපහසුතාවයකට මුහුණ පානු ඇත්තේය යන අවදානමයි. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට සංස්ථාවේ ප්‍රවේශය වන්නේ, හැකිතාක් දුරට, සාමාන්‍ය සහ ආතතිමය හෙවත් පීඩනකාරී තත්ත්වයන් යටතේ, පිළිගත නොහැකි අලාභ දැරීමකින් හෝ සංස්ථාවේ කීර්ති නාමයට හානියක් සිදුවීමේ අවදානමකින් තොරව, එහි වගකීම් නියමිත වේලාවට සැමවිටම සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් තිබෙන බව සහතික කිරීමයි.

3.1.1.10 භාණ්ඩ තොග

තොග මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයටය. සමාගම වසර තුළදී වෙළඳපොල අගයට වඩා අඩු මිලකට නිෂ්පාදන අලෙවි කර නොමැති බැවින් සමාගම විසින් තොග අගය කිරීමට ශුද්ධ උපලබ්ධි අගය භාවිතා කර නොමැත. තොග අත්පත් කර ගැනීමේදී දැරූ වියදම්, නිෂ්පාදන හෝ පරිවර්තන පිරිවැය සහ ඒවා ඒවායේ වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දැරූ වෙනත් පිරිවැයයන් තොගවල පිරිවැයට ඇතුළත් වේ. සමාගම ප්‍රධාන කාර්යාලයේ සහ අලෙවි මධ්‍යස්ථානවල අමු ද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ අගය කිරීම සඳහා යෙදෙන අනුපිළිවෙලගත හෙවත් FIFO සූත්‍රය භාවිතා කරයි.

3.1.1.11 වෙළඳ ලැබිය යුතු දෑ

සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබාගැනීමේ කොන්ත්‍රාත්මය හිමිකමක් පවත්නා විට පමණක් සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සංස්ථාව විසින් වෙළඳ ලැබිය යුතු දෑ මූල්‍ය වත්කම් වශයෙන් හඳුනාගනු ලබයි.

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකුණන ලද භාණ්ඩ හෝ සපයන ලද සේවා සඳහා පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු මුදල් ය. එකතු කිරීම එක් වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ) අපේක්ෂා කරන්නේ නම් ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙළඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධි අගයට ගෙන යනු ලබන අතර, වසර අවසානයේ හිඟව ඇති සියලුම මුදල් සමාලෝචනය කිරීමෙන් පසු වසරකට වැඩි කාලයක් හිඟව පවතින මුදල් සැලකිල්ලට ගනිමින් අඩමාන ලැබිය යුතු දෑ සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. අක්‍රිය ණය හඳුනා ගන්නා වසර තුළදීම කපා හරිනු ලැබේ.

ගිවිසුම්ගත අයිතියේ මුල් නියමයන්ට අනුව සියලු මුදල් එකතු කර ගැනීමට සංස්ථාවට නොහැකි බවට විෂයමූලික සාක්ෂි ඇති විට වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කරනු ලැබේ.

3.1.1.12 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙස නිර්වචනය කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණු සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල්, හිඟ බැංකු අයිරාවන්ගෙන් ශුද්ධ වූ බැංකු තැන්පතුවලින් සමන්විත වේ.

3.2 බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලූ විට හෝ වාර්තාකරන දිනයේ සිට එක් වසරක් ඇතුළත ගෙවීම් කළ යුතු ඒවාය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරන දිනයෙන් එක් වසරකට පසු ගෙවීම් කළ යුතු ශේෂයන්ය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දන්නා සියලු බැරකම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට වර්තමාන නීතිමය හෝ ව්‍යුහාත්මක බැඳීමක් ඇති නම්, එම බැඳීම විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් සහ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වීමට ඉඩ ඇති නම් ප්‍රතිපාදනයක් හඳුනා ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී දන්නා සියලු ප්‍රතිපාදන ගණනය කරනු ලැබ ඇත.

3.2.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු දායකත්වය

සමුච්චිත අරමුදලට ස්ථාවර වත්කම් මූල්‍යනය කිරීම සම්බන්ධයෙන් රජයෙන් ලැබුණු සියලු මුදල් ඇතුළත් වේ.

3.2.2 ණය ගැනීම්

ණය ගැනීම් මුලින් හඳුනාගනු ලබන්නේ ගනුදෙනු පිරිවැය අඩු කළ පසුව ලැබෙන සාධාරණ අගයෙනි. ණය ගැනීම් පසුව ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලැබේ; ලැබීම් (ගනුදෙනු පිරිවැය අඩු කළ පසු) සහ මුදා හැරීමේ අගය අතර ඇති ඕනෑම වෙනසක් සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ණය ගැනීම් කාලය පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. කෙසේ වෙතත්, වාර්තාකරන දිනට කිසිදු ණය ගැනීමක් නොමැත.

3.2.3 සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

